# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,486 - 2026 අප්‍රේල් මස 24 සිකුරාදා - 2026.04.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ජනාධිපතිතුමන් විසින් කරන ලද ප්‍රකාශය ආදිය ... ... | — | රජයේ නිවේදන ... ... ... ... ... | 692 |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — | මිල පාලන දැන්වීම් ... ... ... ... ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — | ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... ... ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... ... ... | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... | — | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... ... ... | 695 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — | නැවියන්ට දැන්වීම් ... ... ... ... ... | — |
| | | සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... ... ... | — |


*සැ.යු.*: (i) ජාතික පාරිසරික (සංශෝධන) පනත් කෙටුම්පත 2026 අප්‍රේල් මස 17 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) විදුලි සංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2026 අප්‍රේල් මස 17 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(iii) මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත 2026 අප්‍රේල් මස 17 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළ කිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 මැයි මස 15 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 අප්‍රේල් මස 30 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


169 - B 082785 - (2026/04)
E - 01

# රජයේ නිවේදන

ලියාපදිංචි කිරීමේ ආ 96.
(එෆ් 2)/2/64.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

ගොඩනැගිල්ල ලියාපදිංචි කිරීමේ සහතිකය

සහතික අංකය : 1562

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තිය යටතේ කරන ලද ඉල්ලීම් ප්‍රකාශය අනුව සසිදේවී ජලදීපන් වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත විස්තර කරනු ලබන ගොඩනැගිල්ල විවාහ සිදුකිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව සහතික කරමි.

| *විස්තරය* | *පිහිටීම* | | *දිස්ත්‍රික්කය* | *දේවගැතිතැන, අයිතිකරු හෝ භාරකරු* | *ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද* |
|---|---|---|---|---|---|
| | *ගම හෝ වීදිය සහ නගර කොට්ඨාසය* | *පත්තුව, කෝරළය හෝ දිස්ත්‍රික්කයේ වෙනත් කොට්ඨාසය* | | | |
| වේලාන්කන්නි ආරෝග්‍ය මාතාවන්ගේ දේවස්ථානය | ආන්දම්කුලම | ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය | ගරු ෆ්‍රැන්සිස් රොහාන් ප්‍රනාන්දු පියතුමා | රෝමානු කතෝලික |

වර්ෂ 2026 ක් වූ අප්‍රේල් මස 06 වැනි දින බත්තරමුල්ලේ දී මාගේ අත්සන තබන ලදී.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 අප්‍රේල් මස 06 දින.
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත,
බත්තරමුල්ල.

04 - 296/1

---

ලියාපදිංචි කිරීමේ ආ 97.
(එෆ් 2)/2/64.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

විවාහ සිදුකිරීම සඳහා දේවස්ථාන ලියාපදිංචි කිරීම

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තියේ විධිවිධාන අනුව සසිදේවී ජලදීපන් නමැති, ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මා විසින්, ප්‍රසිද්ධ දේවස්ථානයක් ලෙස ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල, විවාහ සිදුකිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

| *අංකය* | *ලියාපදිංචි කිරීමේ දිනය* | *විස්තරය* | *පිහිටීම* | *දේවගැතිතැන, අයිතිකරු හෝ භාරකරු* | *ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද* |
|---|---|---|---|---|---|
| 1562 | 2026.03.23 | වේලාන්කන්නි ආරෝග්‍ය මාතාවන්ගේ දේවස්ථානය | ආන්දම්කුලම | ගරු ෆ්‍රැන්සිස් රොහාන් ප්‍රනාන්දු පියතුමා | රෝමානු කතෝලික |

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 අප්‍රේල් මස 06 දින.
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

04 - 296/2

---

*මගේ අංකය* : ආර්ජී/එන්බී/11/2/43/2025/පිටු/සැ.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස්කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වන වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ **2026.04.24** වැනි දින සිට **2026.05.08** වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශකර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2026.05.15 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, ජී කොට්ඨාසයේ, 307 වෙළුමේ, 227 පත්‍රිකාව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, හේවාගම් කෝරළේ, තලංගම පිහිටි "දාඹුගහවත්ත" නමැති ඉඩමේ අංක 2294 සහ 09, 10/පෙබ.62 දරන පිඹුරේ කැබලි අංක 01 සඳහා මායිම් :<br>*උතුර සහ නැගෙනහිර* : දැනට මියගිය දොන් ඒබ්‍රහම් බාලසූරියගේ උරුමකරුවන්ට හිමි දේපළ; | 1. කොළඹ අතිරේක දිස්ත්‍රික් විනිසුරු ඒ. ඊ. බුල්ජන්ස් මහතා විසින් 1962.04.01 වැනි දින අත්සන් කර ප්‍රකාශයට පත් කරන ලද කොළඹ දිස්ත්‍රික් අධිකරණයේ අංක 7789/පී දරන බෙදුම් නඩුවේ අවසාන තීන්දුව. |

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| | *දකුණ* : ලොට් 02;<br>*බස්නාහිර* : පාර සහ පී. ඩී. අරනෝලිස්ට හිමි දෙල්ගහවත්ත;<br>*ප්‍රමාණය* : අ.01, රූ.00, පර්. 10.295 | 2. ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඩී. එන්. කේ. අබේනායක විසින් 1963.02.21 දින ලියා සහතික කරන ලද අංක 487 දරන විකුණුම් ඔප්පුව.<br>3. ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඒ. සීලවතී විසින් 1983.07.06 දින ලියා සහතික කරන ලද අංක 56 දරන තෑගි ඔප්පුව.<br>4. ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඒ. සීලවතී විසින් 1983.07.06 දින ලියා සහතික කරන ලද අංක 55 දරන තෑගි ඔප්පුව. |

04 - 310

---

*මගේ අංකය* : ආර්ජී/එන්බී/11/2/86/2025/පිටු/සැ.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස්කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වන වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ **2026.04.24** වැනි දින සිට **2026.05.08** වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශකර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2026.05.15 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු ය.

**එස්. ජලදීපන්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, එම කොට්ඨාසයේ, 677 වෙළුමේ, 164 පත්‍රිරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළේ, අත්තිඩිය පිහිටි "කහටගහවත්ත" නැමැති ඉඩමට මානක වී. ඒ. එල්. සේනාරත්නගේ අංක 1736 සහ 1960.03.27 දිනැති ලොට් 4 සඳහා මායිම් : | 1. පී. ඒ. ඩී. සමරසේකර ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1960.06.24 දින ලියා සහතික කරන ලද අංක 103 දරන විකුණුම් ඔප්පුව;<br>2. ඩබ්. ඩී. ගමගේ ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2002.07.31 දින ලියා සහතික කරන ලද අංක 2477 දරන තෑගි ඔප්පුව; |

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| | *උතුර* : කිරිපැල්ලගහවත්ත;<br>*නැගෙනහිර* : ලොට් 5 හා ලොට් ඩී; (පාරකට වෙන් කළ)<br>*දකුණ* : ලොට් 6 හා 7;<br>*බස්නාහිර* : ලොට් 3.<br>*බිම් ප්‍රමාණය* : අ.00, රූ.00, පර්. 20.60 | 3. ඩබ්. ඩී. ගමගේ ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2002.07.31 දින ලියා සහතික කරන ලද අංක 2478 දරන තෑගි ඔප්පුව. |

04 - 311

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**ඩීඑෆ්සීසී බැංක් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ඩීඑෆ්සීසී බැංක් පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනාව පිළිබඳව දැන්වීමයි

ඩීඑෆ්සීසී බැංක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව 2026 පෙබරවාරි මස 24 වැනි දින ඒකමතිකව සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව**

ඩීඑෆ්සීසී බැංක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් සිරිපාල රණතුංග විසින් සියල්ල ලියා සහතික කරන ලද අංක 3129, 3152, 3882, 4527, 3878 සහ 3880 දරන උකස් බැඳුම්කරයන් සහ අංක 0002337 දරන හිමිකම් සහතිකය මත ලියා සහතික කළ 2014.10.15 දිනැති අංක 26/281 දරන දිනපොත සහ 2014.10.31 දිනැති අංක 26/282 දරන උකස් කිරීම සඳහා වූ සාධන පත්‍රයන් මත අයවිය යුතු ගෙවීම් කිරීම, සිය ලියාපදිංචි කාර්යාලය පොළොන්නරුවේ පවත්වාගෙන යන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත කරන ලද සමාගමක් වන PV 12024 දරන යුනයිටඩ් බෝල්ට්ස් ඇන්ඩ් ඇසසරීස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් (මෙහි මින්මතු "සමාගම" යනුවෙන් හඳුන්වනු ලබන) විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2025 සැප්තැම්බර් මස 30 වැනි දිනට එකී යුනයිටඩ් බෝල්ට්ස් ඇන්ඩ් ඇසසරීස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් වෙතින් ඩීඑෆ්සීසී බැංක් පීඑල්සී වෙත ඉහත කී අංක 3129, 3152, 3882, 4527, 3878 සහ 3880 දරන උකස් බැඳුම්කරයන් සහ අංක 0002337 දරන හිමිකම් සහතිකය මත ලියා සහතික කළ 2014.10.15 දිනැති අංක 26/281 දරන දිනපොත සහ 2014.10.31 දිනැති අංක 26/282 දරන උකස් කිරීම සඳහා වූ සාධන පත්‍රයන් මත රුපියල් විසි මිලියන හය ලක්ෂ අසූ නව දහස් හයසිය අනූ හතයි ශත අසූ හතක (රු. 20,689,697.87) මුදලක් ද, 2025 ඔක්තෝබර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් හත් මිලියන පන් ලක්ෂ පන්සිය තිස් දෙකයි ශත හැත්තෑවක (රු. 7,500,532.70) මුදල මත පවත්නා අනුපාතය අනුව සෑම මාසයකම වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතිකයට (AWPR SPOT) ඉහළින් වර්ෂයකට සියයට හතක් (7%) බැගින් වූ අනුපාතය මත ගණනය කරනු ලබන පොළිය ද, රුපියල් හතර මිලියන පන් ලක්ෂ හැත්තෑ තුන් දහස් හාරසිය තිස් නවයයි ශත අනූ අටක (රු. 4,573,439.98) මුදල මත සෑම මාසයකම වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතිකයට (AWPR) ඉහළින් වර්ෂයකට සියයට හතක් (7%) බැගින් වූ අනුපාතය මත ගණනය කරනු ලබන පොළිය ද, රුපියල් පස් මිලියන තුන් ලක්ෂ හැත්තෑ තුන් දහස් පන්සිය හතළිස් එකයි ශත හතරක (රු. 5,373,541.04) මුදල මත සෑම මාසයකම වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතිකයට (AWPR) ඉහළින් වර්ෂයකට සියයට හයයි දශම පහක් (6.5%) බැගින් වූ අනුපාතය මත ගණනය කරනු ලබන පොළිය ද, සහ රුපියල් දොළොස් දහස් දෙසිය තිහයි ශත හැත්තෑ හතක (රු. 12,2300.77) මුදල මත වර්ෂයකට සියයට තිස් හයක් (36%) බැගින් වූ අනුපාතය මත ගණනය කරනු ලබන පොළිය ද, අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති බැවින් ද,

තව ද, එකී මුදල වන රුපියල් විසි මිලියන හය ලක්ෂ අසූ නව දහස් හයසිය අනූ හතයි ශත අසූ හතක (රු. 20,689,697.87) මුදලක් ද, 2025 ඔක්තෝබර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් හත් මිලියන පන් ලක්ෂ පන්සිය තිස් දෙකයි ශත හැත්තෑවක (රු. 7,500,532.70) මුදල මත පවත්නා අනුපාතය අනුව සෑම මාසයකම වැඩ කරන පළමුවන දිනයේ දී

ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතිකයට (AWPR SPOT) ඉහළින් වර්ෂයකට සියයට හතක් (7%) බැගින් වූ අනුපාතය මත ගණනය කරනු ලබන පොළිය ද, රුපියල් හතර මිලියන පන් ලක්ෂ හැත්තෑ තුන් දහස් හාරසිය තිස් නවයයි ශත අනූ අටක (රු. 4,573,439.98) මුදල මත සෑම මාසයකම වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතිකයට (AWPR) ඉහළින් වර්ෂයකට සියයට හතක් (7%) බැගින් වූ අනුපාතය මත ගණනය කරනු ලබන පොළිය ද, රුපියල් පස් මිලියන තුන් ලක්ෂ හැත්තෑ තුන් දහස් පන්සිය හතළිස් එකයි ශත හතරක (රු. 5,373,541.04) මුදල මත සෑම මාසයකම වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතිකයට (AWPR) ඉහළින් වර්ෂයකට සියයට හයයි දශම පහක් (6.5%) බැගින් වූ අනුපාතය මත ගණනය කරනු ලබන පොළිය ද, සහ රුපියල් දොළොස් දහස් දෙසිය තිහයි ශත හැත්තෑ හතක (රු. 12,230.77) මුදල මත වර්ෂයකට සියයට තිස් හයක් (36%) බැගින් වූ අනුපාතය මත ගණනය කරනු ලබන පොළිය ද හෝ විකිණීමේ අවස්ථාව දක්වා එයින් නොගෙවා ඉතිරි වී ඇති යම් කොටසක් අයකර ගැනීම සඳහා එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තියේ නියමයන් යටතේ උකස් බැඳුම්කරයන්ගේ ප්‍රඥප්ති සමග අනුකූලව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් වැය කර ඇති සියලු මුදල් ද, ප්‍රචාරක ගාස්තු සහ අනෙකුත් අය කිරීම් ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 3129, 3152, 3882, 4527, 3878 සහ 3880 දරන උකස් බැඳුම්කරයන් සහ අංක 0002337 දරන හිමිකම් සහතිකය මත ලියා සහතික කළ 2014.10.15 දිනැති අංක 26/281 දරන දිනපොත සහ 2014.10.31 දිනැති අංක 26/282 දරන උකස් කිරීම සඳහා වූ සාධන පත්‍රයන් මගින් දන්තනාරායනගේ උදයසිරි අමරදාස, දන්තනාරායනගේ සිරිල් ජයසිංහ සහ දන්තනාරායනගේ චන්ද්‍රසිරි අමරදාස විසින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත උකස් කරන ලද පහත විස්තර කරනු ලබන ඉඩම් සහ ගොඩනැගිලි බලයලත් වෙන්දේසිකරු ජයසූරිය ඇන්ඩ් ජයසූරිය ඔක්ෂනියර්ස් (පීවීටී) එල්ටීඩී ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් ඔවුන් වෙත පැවරී ඇති බලතල අනුව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා කරයි.

### අංක 3129, 3152, 3882 සහ 4527 දරන උකස් බැඳුම්කරයන් මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, මැද පත්තුවේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තමන්කඩුව ප්‍රාදේශීය සභා බලසීමාව තුළ අංක 73D, බැදිවැව ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසයේ, බැදිවැව ගමේ පිහිටි (සර්වේ ජනරාල්වරයා විසින් සාදන ලද අවසන් ජනපද පිඹුරු පොළොන්නරුව (Final Colony Plan Polonnaruwa 110 හි ලොට් 584 හි කොටසක් වන) බලයලත් මිනින්දෝරු ඩී. මුදුන්කොත්ගේ විසින් සාදන ලද 2009.06.25 දිනැති අංක 1971A දරන පිඹුරේ දැක්වෙන ලොට් 01 වශයෙන් ලකුණු කරන ලද ඉඩම් කොටසට මායිම් : උතුරට : අ.ජ.පි.පො. 110 හි ලොට් 585, 435 1/2 ද; නැගෙනහිරට : අ.ජ.පි.පො. 110 හි ලොට් 585 ද; දකුණට: අ.ජ.පි.පො. 110 හි ලොට් 586 සහ අංක 1971B දරන පිඹුරේ ලොට් 02 ද සහ බස්නාහිරට : අ.ජ.පි.පො. 110 හි ලොට් 583 ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් තිස් පහක් (රූ.2, පර්. 35) ක් විශාල ඉඩම වේ. මෙය පොළොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

ඉතාමත් මෑතක දී කරන ලද නැවත මැනුම් පිඹුරකට අනුව,

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, මැද පත්තුවේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තමන්කඩුව ප්‍රාදේශීය සභා බලසීමාව තුළ අංක 73D, බැදිවැව ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසයේ, බැදිවැව ගමේ පිහිටි (සර්වේ ජනරාල්වරයා විසින් සාදන ලද අ.ජ.පි. පො. 110 හි ලොට් 584 හි කොටසක් වන) බලයලත් මිනින්දෝරු ඩී. මුදුන්කොත්ගේ විසින් සාදන ලද 2009.08.29 දිනැති අංක 1971B දරන පිඹුරේ දැක්වෙන ලොට් 01 වශයෙන් ලකුණු කරන ලද ඉඩම් කොටසට මායිම් : උතුරට : අ.ජ.පි.පො. 110 හි ලොට් 585, 435 1/2 ද; නැගෙනහිරට: අ.ජ.පි.පො. 110 හි ලොට් 585 ද; දකුණට : අ.ජ.පි. පො. 110 හි ලොට් 586 සහ අංක 1971B දරන පිඹුරේ ලොට් 02 ද සහ බස්නාහිරට : අ.ජ.පි.පො. 110 හි ලොට් 583 ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් තිස් පහක් (රූ.2, පර්. 35) ක් විශාල ඉඩම වේ. මෙය පොළොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

### අංක 3878 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, මැද පත්තුවේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තමන්කඩුව ප්‍රාදේශීය සභා බලසීමාව තුළ අංක 73D, බැදිවැව ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසයේ, බැදිවැව ගමේ පිහිටි (සර්වේ ජනරාල්වරයා විසින් සාදන ලද අ.ජ.පි.පො. 110 හි ලොට් 584 හි කොටසක් වන) බලයලත් මිනින්දෝරු ඩී. මුදුන්කොත්ගේ විසින් සාදන ලද 2009.06.25 දිනැති අංක 1971A දරන පිඹුරේ දැක්වෙන ලොට් 02 වශයෙන් ලකුණු කරන ලද ඉඩම් කොටසට මායිම් : උතුරට : අංක 1971A දරන පිඹුරේ ලොට් 01 සහ අ.ජ.පි.පො. 110 හි ලොට් 585 ද; නැගෙනහිරට : අ.ජ.පි.පො. 110 හි ලොට් 585 ද; දකුණට : අ.ජ.පි.පො. 110 හි ලොට් 586 ද සහ බස්නාහිරට: අ.ජ.පි.පො. 110 හි ලොට් 583 සහ අංක 1971A දරන පිඹුරේ ලොට් 01 ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් දෙකක් (රූ.2) ක් විශාල ඉඩම වේ. මෙය පොළොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. අබේවර්ධන විසින් ලියා සහතික කළ 2009.10.14 දිනැති අංක 1256 දරන වරද නිවැරදි කිරීමේ ඔප්පුවට අනුව මෙම ඉඩම පහත පරිදි විස්තර කෙරේ.

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, මැද පත්තුවේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තමන්කඩුව ප්‍රාදේශීය සභා බලසීමාව තුළ අංක 73D, බැඳිවැව ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසයේ, බැඳිවැව ගමේ පිහිටි (සර්වේ ජනරාල්වරයා විසින් සාදන ලද අ.ජ.පි.පො. 110 හි ලොට් 584 හි කොටසක් වන) බලයලත් මිනින්දෝරු ඩී. මුදුන්කොත්ගේ විසින් සාදන ලද 2009.08.29 දිනැති අංක 1971B දරන පිඹුරේ දැක්වෙන ලොට් 02 වශයෙන් ලකුණු කරන ලද ඉඩම් කොටසට මායිම් : උතුරට : අංක 1971B දරන පිඹුරේ ලොට් 01 සහ අ.ජ.පි.පො. 110 හි ලොට් 585 ද; නැගෙනහිරට : අ.ජ.පි.පො. 110 හි ලොට් 585 ද; දකුණට: අ.ජ.පි.පො. 110 හි ලොට් 586 ද සහ බස්නාහිරට : අංක 1971B දරන පිඹුරේ ලොට් 01 ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් දෙකක් (අ.0, රූ.2, පර්. 0) ක් විශාල ඉඩම වේ. මෙය පොළොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

**අංක 3880 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය**

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, මැද පත්තුවේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තමන්කඩුව ප්‍රාදේශීය සභා බලසීමාව තුළ අංක 180, මහසෙන් පෙදෙස ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසයේ, තමන්කඩුව ගමේ (වර්තමානයේ පොළොන්නරුව ගමේ) පිහිටි (සර්වේ ජනරාල්වරයා විසින් සාදා ඔහු භාරයේ තබා ඇති අ.ජ.පි.පො. 18 හි ලොට් 62 වශයෙන් දැක්වෙන) බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඒ. පියදාස විසින් සාදන ලද අංක 154/5/2005 දරන පිඹුරේ දැක්වෙන ලොට් 2B වශයෙන් ලකුණු කරන ලද "කුඩවෙල්දමන" නමැති ඉඩම් කොටසට මායිම් : උතුරට : අංක 154/5/2005 දරන පිඹුරේ ලොට් 2A සහ අ.ජ.පි.පො. 18 හි ලොට් 61 (පාර) ද; නැගෙනහිරට: අ.ජ.පි.පො. 18 හි ලොට් 61 (පාර) සහ අංක 154/5/2005 දරන පිඹුරේ ලොට් 08 (පාර) ද; දකුණට : අංක 154/5/2005 දරන පිඹුරේ ලොට් 08, 03 ද සහ බස්නාහිරට : අංක 154/5/2005 දරන පිඹුරේ ලොට් 03 ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් එකක් (රූ.1, පර්. 0) ක් විශාල ඉඩම වේ. මෙය පොළොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

**අංක 0002337 දරන හිමිකම් සහතිකය මත ලියා සහතික කළ 2014.10.15 දිනැති දිනපොත් අංක 26/281 සහ 2014.10.31 දිනැති දිනපොත් අංක 26/282 දරන උකස් කිරීම සඳහා වූ සාධන පත්‍රය මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය**

| | |
|---|---|
| පළාත | : උතුරු මැද |
| දිස්ත්‍රික්කය | : පොළොන්නරුව |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | : මැදිරිගිරිය |
| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | : මැදිරිගිරිය |
| ගම හෝ නගරය | : මැදිරිගිරිය |
| වරිපනම් අංකය | : - |
| කැඩැස්තර සිතියම් අංකය | : 120041 |
| කොට්ඨාස අංකය (Block No.) | : 01 |
| ඉඩම් කොටස් අංකය (Parcel No.) | : 245 |
| වර්ග ප්‍රමාණය | : හෙක්ටයාර 0.0980. |

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්,
ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී.

04-301

---

**ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනාව පිළිබඳ දැන්වීමයි

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව 2026 පෙබරවාරි මස 24 වැනි දින ඒකමතිකව සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව**

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් කේතුමාලා ප්‍රසාදිනී කහවිදාන විසින් ලියා සහතික කරන ලද 2021.11.17 සහ 2024.10.08 දිනැති අංක 5609 සහ 6465 දරන උකස් බැඳුම්කරයන් මත අයවිය යුතු ගෙවීම් කිරීම, සිය ලියාපදිංචි කාර්යාලය මහරගම පවත්වාගෙන යන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත කරන ලද සමාගමක් වන PV00205109 දරන වොයිස්ඩ් මාකටිං සර්විසස් (පීවීටී) එල්ටීඩී (මෙහි මින්මතු "සමාගම" යනුවෙන් හඳුන්වනු ලබන) විසින් පැහැර හැර ඇති හෙයින් ද;

2025 නොවැම්බර් මස 30 වැනි දිනට එකී වොයිස්ඩ් මාකටිං සර්විසස් (පීවීටී) එල්ටීඩී වෙතින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත ඉහත කී අංක 5609 සහ 6465 දරන උකස් බැඳුම්කරයන් මත රුපියල් නව මිලියන එක් ලක්ෂ හතළිස් අට දහස් අටසිය තිහයි ශත පනස් හතක (රු. 9,148,830.57) මුදලක් ද, 2025 දෙසැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් හත් මිලියන හත් ලක්ෂ අනූ හය දහස් පන්සිය හැට හයයි ශත පනස් හයක (රු. 7,796,566.56) මුදල මත සෑම මාසයකම වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතිකයට (AWPR) ඉහළින් ආසන්නතම

0.5% වටයනු ලබන්නා වූ වර්ෂයකට සීයයට අටයි දශම හතයි පහක් (8.75%) බැගින් වූ අනුපාතය මත ගණනය කරනු ලබන පොළිය ද අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති බැවින් ද;

තව ද, එකී මුදල වන රුපියල් නව මිලියන එක් ලක්‍ෂ හතළිස් අට දහස් අටසිය තිහයි ශත පනස් හතක (රු. 9,148,830.57) මුදලක් ද, 2025 දෙසැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් හත් මිලියන හත් ලක්‍ෂ අනූ හය දහස් පන්සිය හැට හයයි ශත පනස් හයක (රු. 7,796,566.56) මුදල මත සෑම මාසයකම වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතිකයට (AWPR) ඉහළින් ආසන්නතම 0.5%ට වටයනු ලබන්නා වූ වර්ෂයකට සියයට අටයි දශම හතයි පහක් (8.75%) බැගින් වූ අනුපාතය මත ගණනය කරනු ලබන පොළිය ද හෝ විකිණීමේ අවස්ථාව දක්වා එයින් නොගෙවා ඉතිරි වී ඇති යම් කොටසක් අයකර ගැනීම සඳහා එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තියේ නියමයන් යටතේ උකස් බැඳුම්කරයන්ගේ ප්‍රඥප්ති සමග අනුකූලව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් වැය කර ඇති සියලු මුදල් ද, ප්‍රචාරක ගාස්තු සහ අනෙකුත් අය කිරීම් ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 5609 සහ 6465 දරන උකස් බැඳුම්කරයන් මගින් නදීක සංජීව හෙට්ටිආරච්චි විසින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත උකස් කරන ලද පහත විස්තර කරනු ලබන ඉඩම බලයලත් වෙන්දේසිකරු චන්දිමා ප්‍රියදර්ශනී ගමගේ ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් ඔවුන් වෙත පැවරී ඇති බලතල අනුව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී හි අධ්‍යක්‍ෂ මණ්ඩලය මෙයින් යෝජනා කරයි.

**අංක 5609 සහ 6465 දරන උකස් බැඳුම්කරයන් මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය**

බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, මුන්වත්තේ බාගේ පත්තුවේ, බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බුලත්සිංහල ප්‍රාදේශීය සභා බලසීමාව තුළ අංක 650E එලවැල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බැල්ලපිටිය පිහිටි කලින් යහල්කැලේ ගෘප් හි සොරණ රජයේ වැවිලි කොටසක් වන දික්හේන කොටස නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. එච්. ඇතුළත්මුදලි විසින් සාදන ලද 1988.10.01 දිනැති අංක 2058 දරන පිඹුරේ දැක්වෙන ලොට් 160 වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් : උතුරට : ලොට් 149, 150 ද; නැගෙනහිරට : ලොට් 445 (පාරක් සඳහා වූ වෙන්කිරීම) ද; දකුණට : ලොට් 166 ද සහ බස්නාහිරට : ලොට් 161 ද වශයෙන් මායිම් වූ එකී අංක 2058 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (පර්. 20)ක් හෝ හෙ. 0.05058ක් විශාල ඉඩම එහි පිහිටි පස, ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියලු දේ ද සමග වේ.

බලයලත් මිනින්දෝරු ඩී. එච්. ඇතුළත්මුදලි විසින් සාදන ලද 1988.10.01 දිනැති අංක 2058 දරන පිඹුරේ දැක්වෙන ලොට් 445, 444, 428, 423 සහ 256 වශයෙන් ලකුණු කොට ඇති පාරවල් සඳහා වූ වෙන් කිරීම් මතින් හා ඔස්සේ වන මාර්ග අයිතිය ද, එම පාරවල් සඳහා වූ වෙන් කිරීම් මතින්, තුළින් සහ/හෝ ඔස්සේ සහ ඉහළින් විදුලි කේබල්, මුදුන් කම්බි, ජලාපවහන, ගෑස් සහ ජලනල එළීමේ අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්,
ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී.

04-302

---

**ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනාව පිළිබඳ දැන්වීමයි

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී හි අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව 2026 පෙබරවාරි මස 24 වැනි දින ඒකමතිකව සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව**

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් කේ. එම්. සුරවීර විසින් ලියා සහතික කරන ලද 2016.05.16 දිනැති අංක 1207 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම, බොරලැස්ගමුවේ පදිංචි වික්‍රමසිංහ මෙරිල් අසෝක ද සොයිසා *හෙවත්* වික්‍රමසිංහ මෙරිල් අසෝක ද සොයිසා *හෙවත්* වික්‍රමසිංහ මෙරිල් අසෝක ද සොයිසා (WICKRAMASINGHE MERIL ASOKA DE SOYZA *alias* WICKRAMASINGHE MERYL ASOKA DE SOYZA *alias* WICKRAMASINGHE MERIL ASOKA DE SOYZA) යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2024 මාර්තු මස 31 වැනි දිනට එකී වික්‍රමසිංහ මෙරිල් අසෝක ද සොයිසා *හෙවත්* වික්‍රමසිංහ මෙරිල් අසෝක ද සොයිසා *හෙවත්* වික්‍රමසිංහ මෙරිල් අසෝක ද සොයිසා යන අයගෙන් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත ඉහත කී අංක 1207 දරන උකස් බැඳුම්කරය මත රුපියල් දහ තුන් මිලියන තුන් ලක්‍ෂ අනූ එක් දහස් අටසිය අටයි ශත හැත්තෑ පහක (රු. 13,391,808.75) මුදලක් ද, 2024 අප්‍රේල් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් හත් මිලියන අට ලක්‍ෂ අනූ නව දහස් අටසිය හැත්තෑ තුනයි ශත විස්සක (රු. 7,899,873.20) මුදල මත පවත්නා අනුපාතය අනුව

සෑම මාසයකම වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතිකයට (AWPR SPOT) ඉහළින් වර්ෂයකට සියයට පහයි දශම පහක් (5.5%) බැගින් වූ අනුපාතය මත ගණනය කරනු ලබන පොළිය ද අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති බැවින් ද,

තව ද, එකී මුදල වන රුපියල් දහ තුන් මිලියන තුන් ලක්ෂ අනූ එක් දහස් අටසිය අටයි ශත හැත්තෑ පහක (රු. 13,391,808.75) මුදලක් ද, 2024 අප්‍රේල් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් හත් මිලියන අට ලක්ෂ අනූ නව දහස් අටසිය හැත්තෑ තුනයි ශත විස්සක (රු. 7,899,873.20) මුදල මත පවත්නා අනුපාතය අනුව සෑම මාසයකම වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතිකයට (AWPR SPOT) ඉහළින් වර්ෂයකට සියයට පහයි දශම පහක් (5.5%) බැගින් වූ අනුපාතය මත ගණනය කරනු ලබන පොළිය ද හෝ විකිණීමේ අවස්ථාව දක්වා එයින් නොගෙවා ඉතිරි වී ඇති යම් කොටසක් අයකර ගැනීම සඳහා එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තියේ නියමයන් යටතේ උකස් බැඳුම්කරයේ ප්‍රඥප්ති සමග අනුකූලව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් වැය කර ඇති සියලු මුදල් ද, ප්‍රචාරක ගාස්තු සහ අනෙකුත් අය කිරීම් ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1207 දරන උකස් බැඳුම්කරය මගින් වික්‍රමසිංහ මෙරිල් අසෝක ද සොයිසා *හෙවත්* වික්‍රමසිංහ මෙරිල් අසෝක ද සොයිසා *හෙවත්* වික්‍රමසිංහ මෙරිල් අසෝක ද සොයිසා විසින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත උකස් කරන ලද පහත විස්තර කරනු ලබන සහාධිපත්‍ය ඉඩම් කොටස බලයලත් වෙන්දේසිකරු තුසිත් කරුණාරත්න ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් ඔවුන් වෙත පැවරී ඇති බලතල අනුව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා කරයි.

**අංක 1207 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය**

**පළමුවන කොටස**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ බොරලැස්ගමුව නගර සභා බලසීමාව තුළ අංක 553A, රත්තනපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බොරලැස්ගමුව උතුර, රත්තනපිටිය පාරේ පිහිටි සහාධිපත්‍ය දේපළ මත වූ සහාධිපත්‍ය ගොඩනැගිල්ලේ පරණ කැස්බෑව පාර (වර්තමානයේ රත්තනපිටිය යනුවෙන් හඳුන්වන) වරිපනම් අංක 46A දරන, 2016 මාර්තු මස 11 වැනි දින බලයලත් මිනින්දෝරු එස්. නඩරාජා විසින් සහතික කරන ලද බලයලත් මිනින්දෝරු කේ. සෙල්වරත්නම් විසින් 2008 අප්‍රේල් මස 18 දින සාදන ලද අංක 11079 දරන සහාධිපත්‍ය පිඹුරේ දැක්වෙන "GFA (බිම් මහල)" වශයෙන් ලකුණු කරන ලද සහාධිපත්‍ය කොටසට (Condominium Parcel) මායිම් -

*උතුරට* : මෙම සහාධිපත්‍ය කොටස සහ CE1, CE19, CE17, CE18 සහ CE3 අතර බිත්තියේ මධ්‍යය ද;

*නැගෙනහිරට* : මෙම සහාධිපත්‍ය කොටස සහ CE1, CE19, CE5, CE17, CE18 සහ CE3 සහ GFA1 අතර බිත්තියේ මධ්‍ය ද;

*දකුණට* : මෙම සහාධිපත්‍ය කොටස සහ CE21 සහ CE13 අතර බිත්තියේ මධ්‍යය ද;

*බස්නාහිරට* : මෙම සහාධිපත්‍ය කොටසේ සහ CE2 සහ අතර බිත්තියේ මධ්‍යය ද සහ මෙම සහාධිපත්‍ය කොටසේ බිත්තිය සමග 2004 ජනවාරි මස 18 දිනැති අංක 2004/401A දරන එකී මැනුම් පිඹුරේ ලොට් 2 ද;

*ඉහළට* : බිම් මහල ද;

*පහළට* : ඉහත FFB සහාධිපත්‍ය කොටසේ කොන්ක්‍රීට් පොළවේ මධ්‍යය ද;

වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් වර්ග මීටර එකසිය හතළිස් දෙකක් (ව.මී. 142)ක් හෝ වර්ග අඩි එක් දහස් පන්සිය විසි අටක් (ව.අඩි 1528) විශාල බිම් ප්‍රදේශය වේ.

මෙම GFA ඒකකය වෙනුවෙන් නොබෙදූ කොටසේ වටිනාකම සහාධිපත්‍ය දේපළේ පොදු පහසුකම්වලින් 15.64%ක් වේ.

GFA සහාධිපත්‍ය කොටසට ක්ෂණික ප්‍රවේශය වන්නේ CE4 වේ.

එකී GFA ඒකකය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

**දෙවන කොටස**

I. සහාධිපත්‍ය දේපළේ ව්‍යවස්ථානුකූල පොදු පහසුකම්, 1982 අංක 45 දරන (සංශෝධන) පනතේ 12 වන වගන්තිය මගින් සංශෝධනය කර ඇති පරිදි 1973 අංක 11 දරන කුලී නිවාස හිමිකාරත්ව නීතියේ 26 වැනි වගන්තියෙන් සහ 2003 අංක 39 දරන කුලී නිවාස හිමිකාරත්ව (සංශෝධන) පනතෙන් සපයා ඇති පරිදි වේ.

(1) සහාධිපත්‍ය දේපළට අයත් විවෘත අවකාශය ඇතුළුව ගොඩනැගිල්ල පිහිටි ඉඩම;

(2) ගොඩනැගිල්ලේ අත්තිවාරම, කුලුණු, ගර්ඩර්ස් (බාල්ක), බීම්ස් (යටලී/ බාල්ක), ආධාරක (සපෝර්ට්ස්), ප්‍රධාන බිත්ති සහ ගොඩනැගිල්ලේ වහල;

(3) විදුලිය, දුරකතන, ගුවන් විදුලි, රිඉන්ෆුෂන් (reinfusion), රූපවාහිනී ජලනල, ජල ටැංකි, ජලය එකතු කිරීම සඳහා තැනුවක් (sump for water), ඉහළ ජල ටැංකි (overhead water tanks), පොම්පස් (pompus), ඩට්ස් (duts), ජලාපවහන පද්ධතිය, කාණු ආදිය ආවරණය කළ විවර (man holes) සහ කැළි කසල පාලනය කිරීම් ආදි ප්‍රධාන සේවා සඳහා සවිකිරීම්.

(4) ඊට සුදුසු හෝ පහසු පොදු භාවිතය සඳහා සාමාන්‍ය පැවැත්ම, ආරක්ෂාව වෙනුවෙන් දේපළේ අනෙකුත් සියලුම කොටස් සහ පහසුකම්.

II. බලයලත් මිනින්දෝරු කේ. සෙල්වරත්නම් විසින් 2008 අප්‍රේල් මස 18 දින සාදන ලද අංක 11079 දරන සහාධිපත්‍ය පිඹුරේ විස්තර කර ඇති සහ නිරූපණය කර ඇති ව්‍යවස්ථානුකූල පොදු පහසුකම්.

**සහාධිපත්‍ය දේපළට ප්‍රවේශය :**

රත්තනපිටිය පාරට සම්බන්ධ වන අඩි 20ක් පළල ප්‍රදේශීය සභා පාර.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්,
ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී.

04-300

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - කුලියාපිටිය ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී.කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංකය : 2671589 සහ 3057763
"ඒ ඒ ඔටෝ මාට්" හි අධිකාරි මුදියන්සේලාගේ අනිල් ධර්මසිරි අධිකාරි

2026 ජනවාරි මස 30 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

කුලියාපිටිය ප්‍රසිද්ධ නොතාරිස් එච්. එස්. පී. පෙරේරා විසින් 2002 ජූනි මස 17 වැනි දින සහතික කරන ලද අංක 5894, 2002 සැප්තැම්බර් මස 05 වැනි දින සහතික කරන ලද අංක 6016 සහ 2011 ජනවාරි මස 10 වැනි දින සහතික කරන ලද අංක 11782 දරන උකස් බැඳුම්කරයන් මගින් මෙහි පහත පළමුවන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම සහ පරිශ්‍රය උකස් කොට බැඳ දමා ඇති කුලියාපිටිය, කුරුණෑගල පාරේ, අංක 74/3 දරන ස්ථානයේ "ඒ ඒ ඔටෝ මාට්" යන නාමය, විලාසය සහ ආයතනය යටතේ තනි අයිතිකරු ලෙස ව්‍යාපාරය පවත්වාගෙන යන නුගේගොඩ, කන්දවත්ත පාරේ, අංක 18A දරන ස්ථානයේ අධිකාරි මුදියන්සේලාගේ අනිල් ධර්මසිරි අධිකාරි ණයකරු හැටියට සහ කුලියාපිටිය, කුරුණෑගල පාරේ, අංක 74 දරන ස්ථානයේ වන්නිආරච්චි කංකානම්ගේ සන්ධ්‍යා ප්‍රියංගනී උකස්කරු හැටියට වෙනත් කරුණු අතර, ඉහත කී පහසුකම් නැවත ගෙවීම සඳහා ඇපය වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද සහ එකී උකස් බැඳුම්කරයන් යටතේ නිසි ලෙස ඉල්ලා සිටියත් අයවිය යුතු මුදල් ගෙවීම එකී අධිකාරි මුදියන්සේලාගේ අනිල් ධර්මසිරි අධිකාරි හා/හෝ වන්නිආරච්චි කංකානම්ගේ සන්ධ්‍යා ප්‍රියංගනී පැහැර හැර ඇති හෙයින්,

සහ කුලියාපිටිය ප්‍රසිද්ධ නොතාරිස් එච්. එස්. පී. පෙරේරා විසින් 2011 ජනවාරි මස 10 වැනි දින සහතික කරන ලද අංක 11783 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. අයි. අල්විස් විසින් 2018 අගෝස්තු මස 16 වැනි දින සහතික කරන ලද අංක 786 දරන උකස් බැඳුම්කරයන් මගින් මෙහි පහත දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම සහ පරිශ්‍රය උකස් කොට බැඳ දමා ඇති එකී "ඒ ඒ ඔටෝ මාට්" හි අධිකාරි මුදියන්සේලාගේ අනිල් ධර්මසිරි අධිකාරි ණයකරු/උකස්කරු හැටියට වෙනත් කරුණු අතර, ඉහත කී පහසුකම් නැවත ගෙවීම සඳහා ඇපය වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද සහ එකී උකස් බැඳුම්කරයන් යටතේ නිසි ලෙස ඉල්ලා සිටියත් අයවිය යුතු මුදල් ගෙවීම එකී අධිකාරි මුදියන්සේලාගේ අනිල් ධර්මසිරි අධිකාරි පැහැර හැර ඇති හෙයින්,

සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. අයි. අල්විස් විසින් 2016 නොවැම්බර් මස 10 වැනි දින සහතික කරන ලද අංක 295 දරන උකස් බැඳුම්කරයක් මගින් මෙහි පහත තුන්වන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම සහ පරිශ්‍රය උකස් කොට බැඳ දමා ඇති එකී "ඒ ඒ ඔටෝ මාට්" හි අධිකාරි මුදියන්සේලාගේ අනිල් ධර්මසිරි අධිකාරි ණයකරු/උකස්කරු හැටියට වෙනත් කරුණු අතර, ඉහත කී පහසුකම් නැවත ගෙවීම සඳහා ඇපය වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද සහ එකී උකස් බැඳුම්කරය යටතේ නිසි ලෙස ඉල්ලා සිටියත් අයවිය යුතු මුදල් ගෙවීම එකී

අධිකාරී මුදියන්සේලාගේ අනිල් ධර්මසිරි අධිකාරී පැහැර හැර ඇති හෙයින්,

සහ වෙනත් කරුණු අතර, මෙහි පහත පෙන්වන පරිදි, ඉහත කී උකස් බැඳුම්කරයන් මත ප්‍රතිව්‍යුහගත කාලීන ණය අංක 2671589 සහ 3057763 සම්බන්ධයෙන් මුල් මුදල සහ පොළිය වශයෙන් 2025 නොවැම්බර් මස 05 වැනි දින වන විට රුපියල් මිලියන එකසිය තිහයි තුන් ලක්‍ෂ හැට දෙදහස් එකසිය අනූ නවයක (රු. 130,362,199.00) ක මුළු මුදලක් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට දැනට අය විය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන එකසිය තිහයි තුන් ලක්‍ෂ හැට දෙදහස් එකසිය අනූ නවය (රු. 130,362,199.00) ක මුදල අයකර ගැනීම සඳහා මෙහි පහත විස්තර කරන පරිදි, වැඩිදුර වාර්ෂික පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට එකී උකස් බැඳුම්කරු අංක 5894, 6016, 11782, 11783, 786 සහ 295 මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස්කොට ඇත්තා වූ ද මෙහි පහත පළමුවන, දෙවන සහ තුන්වන උපලේඛනයෙ හි සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද ඉඩම හා පරිශ්‍රය කොළඹ 08, බොරැල්ල, පෙලෙන්ගස්තුඩුව පාරේ, අංක 109/21 දරන ස්ථානයේ අරච්චාවල සුසිලා කුමාරි යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. අධ්‍යක්‍ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

(a) ප්‍රතිව්‍යුහගත කාලීන ණය අංක 2671589 සඳහා රු. 83,548,371.75ක මුළු මුදලක් (2025 නොවැම්බර් මස 05 වැනි දින වන විට මුල් මුදල සහ පොළිය) සහ 2025 නොවැම්බර් මස 06 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 72,795,000.00 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට 14.00% බැගින් වැඩිදුර වාර්ෂික පොළියක් සමගින් සහ;

(b) ප්‍රතිව්‍යුහගත කාලීන ණය අංක 3057763 සඳහා රු. 46,813,827.25ක මුළු මුදලක් (2025 නොවැම්බර් මස 05 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2025 නොවැම්බර් මස 06 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 39,697,953.00ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට 15.50% බැගින් වැඩිදුර වාර්ෂික පොළියක් සමගින් වේ.

**පළමුවන උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල හත්පත්තුවේ, යටිකහ කෝරළේ දකුණ, කුලියාපිටිය නාගරික සභා සීමා ඇතුළත අස්සැද්දුම ගමේ පිහිටි "පිදිවිල්ලේහේන" ලෙස නම්කොට හඳුන්වන ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. බී. අබේකෝන් විසින් 2010 නොවැම්බර් මස 16 වැනි දින පිළියෙල කරන ලද අංක 10424 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද එහි පිහිටි ස්ථිර ගොඩනැගිල්ලක් සහිත ඉඩම් කොටසට මායිම් වශයෙන් : උතුරට : ප්‍රධාන P.W.D. පාර සහ වරිපනම් අංක 78 දරන ඉඩම, ඩබ්ලිව්. එම්. ආර්. ද සිල්වා විසින් හිමිකම්ලත් බලයලත් මිනින්දෝරු ජේ. එල්. වීරවර්ධන විසින් පිළියෙල කරන ලද අංක 3735 දරන පිඹුරේ ලොට් 3 මගින් ද; නැගෙනහිරට: වරිපනම් අංක 78 දරන ඉඩම, ඩබ්ලිව්. එම්. ආර්. ද සිල්වා විසින් හිමිකම්ලත් බලයලත් මිනින්දෝරු, ජේ. එල්. වීරවර්ධන විසින් පිළියෙල කරන ලද අංක 3735 දරන පිඹුරේ ලොට් 3 සහ ජී. ටී. එම්. ප්‍රනාන්දු විසින් හිමිකම්ලත් එකී පිඹුරේ ලොට් 4 ලකුණු කරන ලද වරිපනම් අංක 82 මගින් ද; දකුණට : බලයලත් මිනින්දෝරු එන්. එස්. එල්. ප්‍රනාන්දු විසින් පිළියෙල කරන ලද අංක 1143 දරන පිඹුරේ ලොට් 13 මගින් ද; සහ බස්නාහිරට : අඩි විස්ස (20) පළල පාරක් සඳහා වෙන්කිරීම මගින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව පර්චස් දාහතයි දශම හතරයි නවයක (පර්. 17.49) විශාලත්වයෙන් වූ ඉඩම සමග අංක 10424 දරන පිඹුරේ දැක්වෙන පස, ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

එකී ඉඩම පහත දැක්වෙන ඉඩමේ ඒකාබද්ධකිරීමක් සහ නැවත මැනීමක් වේ.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල හත්පත්තුවේ, යටිකහ කෝරළේ දකුණ, කුලියාපිටිය නාගරික සීමා ඇතුළත අස්සැද්දුම ගමේ පිහිටි "පිදිවිල්ලේහේන දැන් වත්ත" ලෙස නම්කොට හඳුන්වන ඉඩමට බලයලත් මිනින්දෝරු, ජේ. එල්. වීරවර්ධන විසින් 1988 මැයි මස 26 වැනි දින පිළියෙල කරන ලද අංක 3735 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද එහි පිහිටි ස්ථිර ගොඩනැගිල්ලක් සහිත ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : මාදම්පේ සිට කුරුණෑගල දක්වා ප්‍රධාන P.W.D. පාර මගින් ද; නැගෙනහිරට: ඉහත කී අංක 3735 දරන පිඹුරේ ලොට් 2 සහ 4 මගින් ද; දකුණට : බලයලත් මිනින්දෝරු, එන්. එස්. එල්. ප්‍රනාන්දු විසින් පිළියෙල කරන ලද අංක 1143 දරන පිඹුරේ ලොට් 13 මගින් ද; සහ බස්නාහිරට : අඩි විස්ස (20) පළල පාරක් සඳහා වෙන්කිරීම මගින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව පර්චස් එකොළහයි දශම එකයි දෙක (අ.0, රූ.0, පර්. 11.12)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග පස, ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සහ ඊට අදාළ වන සියලු දේත් සමග සහ ඉහත කී අංක 3735 දරන පිඹුරේ දැක්වෙන අඩි විස්ස (20) පළල පාරක් සඳහා වෙන්කිරීම භාවිතයට සංවර්ධනයට සහ නඩත්තුකිරීමට ඇති අයිතිය සමග වන මෙය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව J 142/216 යටතේ ලියාපදිංචි කර ඇත.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල හත්පත්තුවේ, යටිකහ කෝරළේ දකුණ, කුලියාපිටිය නාගරික සභා සීමා ඇතුළත අස්සැද්දුම ගමේ පිහිටි "පිදිවිල්ලේහේන දැන් වත්ත" ලෙස නම්කොට හඳුන්වන ඉඩමට බලයලත් මිනින්දෝරු, ජේ. එල්. වීරවර්ධන විසින් 1988 මැයි මස 26 වැනි දින පිළියෙල කරන ලද අංක 3735 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද එහි පිහිටි ස්ථිර ගොඩනැගිල්ලක් සහිත ලොට් 2 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : මාදම්පේ සිට

කුරුණෑගල දක්වා ප්‍රධාන P.W.D. පාර මගින් ද; නැගෙනහිරට: එකී පිඹුරේ ලොට් 3 මගින් ද; දකුණට සහ බස්නාහිරට : එකී පිඹුරේ ලොට් 1 මගින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව පර්චස් බිංදුවයි හයයි දශම තුනයි හත (අ.0, රූ,0, පර්. 06.37) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග පස, ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සහ ඊට අදාළවන සියලු දේත් සමග සහ එකී ඉඩම කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව J 142/217 යටතේ ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටෙ මහ නගර සභා සීමා ඇතුළත සහ කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 519B, නුගේගොඩ බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත නුගේගොඩ උතුර අංක 08 දරන කොට්ඨාසයේ, නුගේගොඩ, කන්දේවත්ත පාර ඔස්සේ පිහිටි වරිපනම් අංක 18A දරන "නුගේගොඩ එස්ටේට්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ඒ. වීරක්කොඩි විසින් 1988 පෙබරවාරි මස 08 වැනි දින පිළියෙල කරන ලද අංක 269 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 2 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : සරසවි උද්‍යානය, පරිශ්‍ර අංක 11 සහ 9 මගින් ද; නැගෙනහිරට : කන්දේවත්ත පාර, පරිශ්‍ර අංක 16 මගින් ද; දකුණට : කන්දේවත්ත පාර මගින් ද; සහ බස්නාහිරට : මෙහි ලොට් 1 මගින් ද මායිම් වූ එකී අංක 269 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දොළහයි දශම දෙකයි බිංදුව (පර්. 12.20)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව A 10/121 යටතේ ලියාපදිංචි කර ඇත.

### තුන්වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල - ගල්කිස්ස මහා නගර සභා සීමා ඇතුළත, දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 537, විලවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ඇතුළත කිරුළපන පිහිටි දුටුගැමුණු වීදියේ, වරිපනම් අංක 27 දරන "දවටගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ඒ. වීරක්කොඩි විසින් 2013 ජනවාරි මස 04 වැනි දින (නමුත් වඩාත් නිවැරදිව 2013 ජනවාරි මස 08) පිළියෙල කරන ලද අංක 1620 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 11412 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් : උතුරට : ලොට් A (දුටුගැමුණු වීදියේ, වරිපනම් අංක 25) සහ ලොට් 479 (දුටුගැමුණු වීදියේ, වරිපනම් අංක 23) මගින් ද; නැගෙනහිරට : ලොට් 487 සහ 487A (දුටුගැමුණු වීදියේ, වරිපනම් අංක 33) මගින් ද; දකුණට : ලොට් AB1 (දුටුගැමුණු වීදියේ, වරිපනම් අංක 33/2) මගින් ද සහ බස්නාහිරට : ලොට් 11413 (පළල් කරන පාර සඳහා වෙන්කිරීම) මගින් ද මායිම් වූ අංක 1620 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විසි තුනයි දශම දෙකයි පහ (අ.0, රූ.0, පර්.23.25)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව SPE 12/12 යටතේ ලියාපදිංචි කර ඇත.

දුටුගැමුණු වීදිය සඳහා පාර පළල් කිරීම සඳහා පහත සඳහන් වෙන්කිරීම තුළ මතින් සහ ඔස්සේ මාර්ග අයිතිය සමග වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල - ගල්කිස්ස මහා නගර සභා සීමා ඇතුළත, දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 537, විලවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ඇතුළත කිරුළපන පිහිටි "දවටගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ඒ. වීරක්කොඩි විසින් 2013 ජනවාරි මස 04 වැනි දින (නමුත් වඩාත් නිවැරදිව 2013 ජනවාරි මස 08) පිළියෙල කරන ලද අංක 1620 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 11413 (පළල් කරන පාර සඳහා වෙන්කිරීම) වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ලොට් A (දුටුගැමුණු වීදියේ, වරිපනනම් අංක 25) මගින් ද; නැගෙනහිරට : ලොට් 11412 මගින් ද; දකුණට: ලොට් AB1 (දුටුගැමුණු වීදියේ, වරිපනම් අංක 33/2) මගින් ද සහ බස්නාහිරට : දුටුගැමුණු වීදිය මගින් ද මායිම් වූ අංක 1620 දරන පිඹුර ප්‍රකාරව පර්චස් එකයි දශම පහ (අ.0, රූ.0, පර්. 1.5)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව SPE 12/14 යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

2026 ජනවාරි මස 30 දින.

04 - 305

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - හලාවත ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී.කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංකය : 2305658
කෙවිට්යාගල විතානගේ නදීෂා රංග ලෝචිනි ජයසේකර සහ මිහිඳුකුලසූරිය ජුඩ් ප්‍රසාද් සුරන්ජි ප්‍රනාන්දු

2026 ජනවාරි මස 30 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

වයික්කාල ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එන්. අයි. එස්. යූ. ප්‍රනාන්දු විසින් 2018.09.11 වැනි දින සහතික කරන ලද අංක 18797 දරන උකස් බැඳුම්කරය සමග අංක 18798 දරන අතිරේක උකස් බැඳුම්කරයක් මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද දේපළ උකස් කොට බැඳ දමා ඇති මුන්නේශ්වරම්, හතුපිටිය වත්ත හි එසේම කොළඹ 13, කොටහේන, සුමිත්‍රාරාම මාවතේ, අංක 190 දරන ස්ථානයේ කෙවිටියාගල විතානගේ නදීෂා රංග ලෝචිනි ජයසේකර සහ මිහිඳුකුලසූරිය ජුඩ් ප්‍රසාද් සුරන්ජි ප්‍රනාන්දු ණයකරුවන් හැටියට වෙනත් කරුණු අතර ඉහත කී පහසුකම නැවත ගෙවීම සඳහා ඇපය වශයෙන්, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ එකී උකස් බැඳුම්කර යටතේ නිසි ලෙස ඉල්ලා සිටියත් අයවිය යුතු මුදල් ගෙවීම එකී කෙවිටියාගල විතානගේ නදීෂා රංග ලෝචිනි ජයසේකර සහ මිහිඳුකුලසූරිය ජුඩ් ප්‍රසාද් සුරන්ජි ප්‍රනාන්දු පැහැර හැර ඇති හෙයින්;

සහ වෙනත් කරුණු අතර, මෙහි පහත පෙන්වන පරිදි, ඉහත කී උකස් බැඳුම්කර මත, ප්‍රතිව්‍යුහගත නිවාස ණය අංක 2305658 සම්බන්ධයෙන් මුල් මුදල සහ පොළිය වශයෙන් යූරෝ පනස් හත් දහස් එකසිය හතළිස් නවයයි ශත තිස් එක (යූරෝ 57,149.31)ක මුළු මුදලක් 2025 දෙසැම්බර් මස 31 දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට දැන් අය විය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී යූරෝ පනස් හත් දහස් එකසිය හතළිස් නවයයි ශත තිස් එක (යූරෝ 57,149.31) ක මුදල [හෝ පියවීමේ කාලය වන විට පවතින විදේශ විනිමය අනුපාතයට ශ්‍රී ලංකා රුපියල් වලින් ඊට සමාන මුදල] අයකර ගැනීම සඳහා සහ 2026 ජනවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට එකී ප්‍රතිව්‍යුහගත නිවාස ණය අංක 2305658 මත යූරෝ 49,904.47ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට යූරෝ ESTR අගය + 3% බැගින් (එනම්, 2025.12.31 වැනි දින වන විට 4.927% බැගින්) වැඩිදුර පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට ඉහත කී අංක 18797 සහ 18798 දරන උකස් බැඳුම්කරයන් යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස්කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද දේපළ, කොළඹ 08, බොරැල්ල, පෙලෙන්ගස්තුඩුව පාරේ, අංක 109/21 දරන ස්ථානයේ අරච්චාවල සුසිලා කුමාරි යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, උතුරු පිටිගල් කෝරළේ, මුන්නේස්සරම් පත්තුවේ, හලාවත ප්‍රාදේශීය සභා සීමා ඇතුළත හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මුන්නේස්සරම් ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත මුන්නේස්සරම් ගමේ පිහිටි "හතුපිටියවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. එම්. එස්. කේ. හේරත් විසින් 2016.08.28 වැනි දින පිළියෙල කරන ලද අංක 5561 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 02 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : බලයලත් මිනින්දෝරු එම්. එම්. පී. ඩී. පෙරේරා විසින් පිළියෙල කරන ලද අංක 7705 දරන පිඹුරේ ලොට් 3 සහ (අඩි 15 පළල පාර) මගින් ද; නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු එච්. එම්. එස්. කේ. හේරත් විසින් පිළියෙල කරන ලද අංක 4961 දරන පිඹුරේ ලොට් 01 මගින් ද; දකුණට : පී. ඒ. ආර්. පෙරේරාගේ ඉඩම, ආර්. ඩී. පීරිස්ගෙ ඉඩම සහ සෝවිස්ගේ ඉඩම මගින් ද සහ බස්නාහිරට: එච්. එම්. එස්. කේ. හේරත් විසින් පිළියෙල කරන ලද අංක 5561 දරන පිඹුරේ ලොට් 01 මගින් ද මායිම් වූ එකී අංක 5561 දරන පිඹුර ප්‍රකාරව රූඩ් එක (රූ.1, පර්. 0)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි එහි පිහිටි සියලු දේත් සමග වන මෙය හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිකාව A 15/123 යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

2026 ජනවාරි මස 30 දින.

04 - 303

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - හික්කඩුව ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී.කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංකය : 2745046 සහ 2745043
බෙල්ලනගේ චන්දන උබේසේකර

2025 නොවැම්බර් මස 28 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. ඒ. ඩී. සී. කේ. පෙරේරා විසින් 2016 අගෝස්තු මස 18 වැනි දින සහතික කරන ලද අංක 122, 2018 අප්‍රේල් මස 03 වැනි දින සහතික කරන ලද අංක 287 සහ 2022 අප්‍රේල් මස 21 වැනි දින සහතික කරන ලද අංක 813 දරන උකස් බැඳුම්කරයන් මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද දේපළ (සහ/හෝ මින්මතු සඳහන් කරන උකස් බැඳුම්කරයන්හි උපලේඛනවල) උකස් කොට බැඳ

දමා ඇති, පානදුර, අලුබෝමුල්ල, හොරණ පාරේ, අංක 134/B දරන ස්ථානයේ බෙල්ලනගේ චන්ද්‍රන උබේසේකර ණයකරු සහ/ හෝ උකස්කරු හැටියට වෙනත් කරුණු අතර, ඉහත කී පහසුකම් නැවත ගෙවීම සඳහා ඇපය වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද එකී උකස් බැඳුම්කරයන් යටතේ ඉල්ලා සිටියත් අයවිය යුතු මුදල් ගෙවීම් එකී බෙල්ලනගේ චන්ද්‍රන උබේසේකර පැහැර හැර ඇති හෙයින්,

සහ වෙනත් කරුණු අතර, මෙහි පහත පෙන්වන පරිදි, ඉහත කී උකස් බැඳුම්කරයන් මත ප්‍රතිව්‍යුහගත කාලීන ණය අංක 2745046 සම්බන්ධයෙන් මුල් මුදල සහ පොළිය සහ ප්‍රතිව්‍යුහගත කාලීන ණය අංක 2745043 යටතේ දිය යුතු මුල් මුදලේ කොටස වශයෙන් 2025 අගෝස්තු මස 08 වැනි දින වන විට රුපියල් මිලියන අසූ තුනයි පන් ලක්‍ෂ දහ තුන් දහස් තුන්සිය තිහයි ශත හතළිස් පහ (රු. 83,513,330.45)ක මුළු මුදලක් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට දැනට අය විය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන අසූ තුනයි පන් ලක්‍ෂ දහ තුන් දහස් තුන්සිය තිහයි ශත හතළිස් පහ (රු. 83,513,330.45) ක මුදල අයකර ගැනීම සඳහා මෙහි පහත විස්තර කරන ලද පරිදි, වැඩිදුර වාර්ෂික පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට ඉහත කී උකස් බැඳුම්කර අංක 122, 287 සහ 813 යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස්කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද දේපළ, කොළඹ 08, බොරැල්ල, පෙලෙන්ගස්තුඩුව පාරේ, අංක 109/21 දරන ස්ථානයේ අරච්චාවල සුසිලා කුමාරි යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්‍ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

(a) ප්‍රතිව්‍යුහගත කාලීන ණය අංක 2745046 සඳහා රු. 79,088,217.45ක මුළු මුදලක් (2025 අගෝස්තු මස 08 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2025 අගෝස්තු මස 09 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 64,025,887.00ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට 13.75% බැගින් වැඩිදුර වාර්ෂික පොළියක් සමගින් සහ;

(b) පොළී රහිත ප්‍රතිව්‍යුහගත කාලීන ණය අංක 2745043 සඳහා රු. 4,425,113.00 ක මුල් මුදලේ කොටසක් (රු. 13,243,120.00 ක එකතුවෙන් වේ.)

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, උඩුගහ පත්තුවේ, හොරණ ප්‍රාදේශීය සභා සීමා (උප කාර්යාලය පෝරුවදණ්ඩ) සහ ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත 621 - රත්මල්ගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත, රත්මල්ගොඩ ගමේ පිහිටි වර්තමානයේ සන්සෙට් එස්ටේට් ලෙස හඳුන්වන රත්මල්ගොඩවත්තේ කට්ටිය නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩී. පියසිරි විසින් 1989 දෙසැම්බර් මස 31 වැනි දින පිළියෙල කරන ලද අංක 1750 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 2A වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ගම පුළුල්කිරීම යටතේ පවරා දුන් රත්මල්ගොඩවත්තේ කට්ටිය හි කොටස මගින් ද; නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු සිරි බෝපේආරච්චි විසින් පිළියෙල කරන ලද අංක 279 දරන පිඹුරේ ලොට් 1 සහ ලොට් 2B මගින් ද; දකුණට : ලොට් 2B සහ ගම පුළුල් කිරීම යටතේ පවරා දුන් රත්මල්ගොඩවත්තේ කට්ටිය හි කොටස මගින් ද සහ බස්නාහිරට : හඳපාන්ගොඩ සිට පෝරුවදණ්ඩ දක්වා ප්‍රධාන පාර මගින් ද මායිම් වූ එකී අංක 1750 දරන පිඹුර ප්‍රකාරව අක්කර තුනයි රූඩ් දෙකයි පර්චස් විසි අටයි දශම හතර (අ.03, රූ.02, පර්. 28.4) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව M 15/133 යටතේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු ඩී. අනුර ධර්මසිරි විසින් 2004 ජූලි මස 22 වැනි දින පිළියෙල කරන ලද අංක 2662 දරන පිඹුරේ ඉහත කී ඉඩම් කොටස මැත මැනීමකට අනුව පහත පරිදි විස්තර වේ.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, උඩුගහ පත්තුවේ, හොරණ ප්‍රාදේශීය සභා සීමා (උප කාර්යාලය පෝරුවදණ්ඩ) සහ ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත 621 - රත්මල්ගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත, රත්මල්ගොඩ ගමේ පිහිටි වර්තමානයේ සන්සෙට් එස්ටේට් ලෙස හඳුන්වන රත්මල්ගොඩවත්තේ කට්ටිය නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. අනුර ධර්මසිරි විසින් 2004 ජූලි මස 22 වැනි දින පිළියෙල කරන ලද අංක 2662 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 2A වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ගම පුළුල් කිරීම යටතේ පවරා දුන් රත්මල්ගොඩවත්තේ කට්ටිය හි කොටස මගින් ද; නැගෙනහිරට: අංක 279 දරන පිඹුරේ ලොට් 1 සහ අංක 1750 දරන පිඹුරේ ලොට් 2B මගින් ද; දකුණට : ගම පුළුල් කිරීම යටතේ පවරා දුන් රත්මල්ගොඩවත්තේ කට්ටිය හි කොටස මගින් ද සහ බස්නාහිරට: හඳපාන්ගොඩ සිට පොරුවදණ්ඩ දක්වා ප්‍රධාන පාර මගින් ද මායිම් වූ එකී අංක 2662 දරන පිඹුර ප්‍රකාරව අක්කර තුනයි රූඩ් දෙකයි පර්චස් දොළහ (අ.03, රූ.02, පර්.12)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

ආර්. ඒ. පී. රාජපක්‍ෂ,
සමාගම් ලේකම්.

2025 නොවැම්බර් මස 28 වැනි දින.

04 - 304

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

### සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනා සම්මතය

2026 ජනවාරි මස 28 දින පවත්වන ලද නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී පහත දැක්වෙන යෝජනා සම්මතය විශේෂයෙන්ම සහ ඒකමතිකව සම්මත කරන ලදී; එනම් -

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (බැංකුව) ආයතනය වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සනුෂි සුමායා හේමන්තා විසින් සහතික කරන ලද 2018.07.13 දින අංක 135 දරන උකස් බැඳුම්කරය මගින් සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පරාන ලියනගේ උරේෂා ඔෂිනි ලියනගේ විසින් සහතික කරන ලද 2023.08.02 දින අංක 41 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කර පවරා දෙන ලද මෙහි උපලේඛනවල සවිස්තරාත්මකව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍ර ඇපයට තබා ඒවාට එරෙහිව ප්‍රදානය කරන ලද ණය මුදල්/ මූල්‍ය පහසුකම් මත අයවිය යුතු මුදල් ආපසු ගෙවීම ("I වන ණය ගැනුම්කරු වන") ස්වකීය ලියාපදිංචි කාර්යාලය අංක 125, දෙහිවල පාර, බොරලැස්ගමුව යන ස්ථානයේ පිහිටා ඇත්තා වූ ද ලියාපදිංචි අංක PV886 යටතේ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යථා පරිදි සංස්ථාගත කර ඇති සමාගමක් වන MRC ඇසෝසියේට්ස් ගාමන්ටස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන ආයතනය විසින් සහ ("II වන ණය ගැණුම්කරු වන") ස්වකීය ලියාපදිංචි කාර්යාලය, අංක 125, දෙහිවල පාර, බොරලැස්ගමුව යන ස්ථානයේ පිහිටා ඇත්තා වූ ද ලියාපදිංචි කිරීමේ අංක PV 1187 යටතේ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යථා පරිදි සංස්ථාගත කර ඇති සමාගමක් වන MRC එම්බ්‍රොයිඩරි (ප්‍රයිවට්) ලිමිටඩ් යන ආයතනය විසින් පැහැර හැර ඇති හෙයින් ද;

මෙහි උපලේඛනයේ සවිස්තරාත්මකව විස්තර කර ඇති නිශ්චල දේපළෙහි සහ පරිශ්‍රයෙහි බදු ගෙවීමෙන් නිදහස් සින්නක්කර අයිතිකරු වන MRC ඇසෝසයේට්ස් ගාමන්ටස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන ආයතනය විසින් ස්වකීය සින්නක්කර අයිතිවාසිකම්, හිමිකම් සහ සම්බන්ධතා ඉහත කී 2018.07.13 දින අංක 135 දරන උකස් බැඳුම්කරය යටතේ සහ 2023.08.02 දින අංක 41 දරන උකස් බැඳුම්කරය යටතේ බැංකුව වෙත උකස් කර ඇති හෙයින් ද;

2025 මැයි මස 01 දිනය වන විට ඉහත කී අංක 135 සහ අංක 41 දරන උකස් බැඳුම්කර මත බැංකුව වෙත (2025.05.01 දිනට පැවති ශ්‍රී.ල.රු. 299.65 ක් වූ මුදල් පරිවර්තනය කිරීමේ අනුපාතිකයට අනුව ගණනය කරන ලද) ශ්‍රී ලංකා රුපියල් මිලියන තුන්සිය දහනවයයි දෙලක්ෂ හතළිස් හතර දහස් හත්සිය දහඅටයි ශත හැත්තෑනවයක් වූ මුදලකට (රු. 319,244,718.79) සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන එකයි හැටපන්දහස් තුන්සිය අනූදෙකයි ශත දෙකක් වූ මුදලක් (එ.ජ.ඩො. 1,065,392.02) සහ රුපියල් මිලියන විසිහතයි පන්ලක්ෂ තිස්පන්දහස් නවසිය පනස් අටයි ශත නවයක් වූ මුදලක් (රු. 27,535,958.09) ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින හෙයින් ද;

අනතුරුව කිසියම් ගෙවීමක් (සිදුකර ඇත්නම්) එම ගෙවීම අඩු කිරීමෙන් පසුව, ප්‍රධාන පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව දරන ලද ප්‍රචාරක පිරිවැය, විකුණුම් පිරිවැය සහ වෙනත් යම් ගාස්තු ද සමග (2025.05.01 දිනට පැවති ශ්‍රී.ල.රු. 299.65 ක් වූ මුදල් මුදල් පරිවර්තනය කිරීමේ අනුපාතිකයට අනුව ගණනය කරන ලද) ශ්‍රී ලංකා රුපියල් මිලියන තුන්සිය දහනවයයි දෙලක්ෂ හතළිස් හතර දහස් හත්සිය දහඅටයි ශත හැත්තෑනවයක් වූ (රු. 319,244,718.79) මුදලකට සමාන ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන එකයි හැටපන්දහස් තුන්සිය අනූදෙකයි ශත දෙකක් වූ මුදලක් (රු. 1,065,392.02) සහ රුපියල් මිලියන විසිහතයි පන්ලක්ෂ තිස්පන්දහස් නවසිය පනස් අටයි ශත නවයක් වූ මුදලක් (රු. 27,535,958.09) හෝ දේපළ වෙන්දේසි දිනය වන විට නොගෙවා ඉතිරිව පවතින එහි යම් කොටසක් සහ;

(i) 2025.05.02 දින සිට දේපළ වෙන්දේසි දිනය තෙක් වර්ෂයකට සියයට එකොළහයි දශම දෙකයි පහක් වූ (11.25%) අනුපාතිකය යටතේ ඉහත කී අංක 135 සහ අංක 41 දරන උකස් බැඳුම්කර සම්බන්ධයෙන් වන විට එම උකස් බැඳුම්කර මගින් ඇපයෙන් සුරක්ෂිත කරන ලද එක්සත් ජනපද ඩොලර් අසූහයදහසක් වූ (එ.ජ.ඩො. 86,000.00) මූලික මුදල හෝ 2025.05.01 දිනට පැවති එයට සමාන ශ්‍රී ලංකා රුපියල්වලින් වූ මූලික මුදලක් මත පොළිය ද;

(ii) 2025.05.02 දින සිට දේපළ වෙන්දේසි දිනය තෙක් වර්ෂයකට සියයට එකොළහයි දශම දෙකයි පහක් වූ (11.25%) අනුපාතිකය යටතේ ඉහත කී අංක 135 සහ අංක 41 දරන උකස් බැඳුම්කර සම්බන්ධයෙන් වන විට එම උකස් බැඳුම්කර මගින් ඇපයෙන් සුරක්ෂිත කරන ලද එක්සත් ජනපද ඩොලර් හාරලක්ෂ හැත්තෑ තුන්දහස් දෙසිය හැට හයයි ශත තිස් අටක් වූ (එ.ජ.ඩො. 473,266.38) මූලික මුදල හෝ 2025.05.01 දිනට පැවති එයට සමාන ශ්‍රී ලංකා රුපියල්වලින් වූ මූලික මුදලක් මත පොළිය ද;

(iii) 2025.05.02 දින සිට දේපළ වෙන්දේසි දිනය තෙක් වර්ෂයකට සියයට එකොළහයි දශම දෙකයි පහක් වූ (11.25%) අනුපාතිකය යටතේ ඉහත කී අංක 135 සහ අංක 41 දරන උකස් බැඳුම්කර සම්බන්ධයෙන් වන විට එම උකස් බැඳුම්කර මගින් ඇපයෙන් සුරක්ෂිත කරන ලද එක්සත් ජනපද ඩොලර් හැත්තෑ හත්දහසක් වූ (එ.ජ.ඩො. 77,000.00) මූලික මුදල හෝ 2025.05.01 දිනට පැවති

එයට සමාන ශ්‍රී ලංකා රුපියල්වලින් වූ මූලික මුදලක් මත පොළිය ද;

(iv) 2025.05.02 දින සිට දේපළ වෙන්දේසි දිනය තෙක් වර්ෂයකට සියයට එකොළහයි දශම දෙකයි පහක් වූ (11.25%) අනුපාතිකය යටතේ ඉහත කී අංක 135 සහ අංක 41 දරන උකස් බැඳුම්කර සම්බන්ධයෙන් වන විට එම උකස් බැඳුම්කර මගින් ඇපයෙන් සුරක්ෂිත කරන ලද එක්සත් ජනපද ඩොලර් දහඅටදහසක් වූ (එ.ජ.ඩො. 18,000.00) මූලික මුදල හෝ 2025.05.01 දිනට පැවති එයට සමාන ශ්‍රී ලංකා රුපියල්වලින් වූ මූලික මුදලක් මත පොළිය ද;

(v) 2025.05.02 දින සිට දේපළ වෙන්දේසි දිනය තෙක් වර්ෂයකට සියයට එකොළහයි දශම දෙකයි පහක් වූ (11.25%) අනුපාතිකය යටතේ ඉහත කී අංක 135 සහ අංක 41 දරන උකස් බැඳුම්කර සම්බන්ධයෙන් වන විට එම උකස් බැඳුම්කර මගින් ඇපයෙන් සුරක්ෂිත කරන ලද එක්සත් ජනපද ඩොලර් විසිනවදහසක් වූ (එ.ජ.ඩො. 29,000.00) මූලික මුදල හෝ 2025.05.01 දිනට පැවති එයට සමාන ශ්‍රී ලංකා රුපියල්වලින් වූ මූලික මුදලක් මත පොළිය ද;

(vi) 2025.05.02 දින සිට දේපළ වෙන්දේසි දිනය තෙක් වර්ෂයකට සියයට එකොළහයි දශම දෙකයි පහක් වූ (11.25%) අනුපාතිකය යටතේ ඉහත කී අංක 135 සහ අංක 41 දරන උකස් බැඳුම්කර සම්බන්ධයෙන් වන විට එම උකස් බැඳුම්කර මගින් ඇපයෙන් සුරක්ෂිත කරන ලද එක්සත් ජනපද ඩොලර් ලක්ෂ දෙකක් වූ (එ.ජ.ඩො. 200,000.00) මූලික මුදල හෝ 2025.05.01 දිනට පැවති එයට සමාන ශ්‍රී ලංකා රුපියල්වලින් වූ මූලික මුදලක් මත පොළිය ද;

(vii) 2025.05.02 දින සිට දේපළ වෙන්දේසි දිනය තෙක් වර්ෂයකට සියයට විස්සයි දශම දෙකක් පහක් වූ (20.25%) අනුපාතිකය යටතේ ඉහත කී අංක 135 සහ අංක 41 දරන උකස් බැඳුම්කර සම්බන්ධයෙන් වන විට එම උකස් බැඳුම්කර මගින් ඇපයෙන් සුරක්ෂිත කරන ලද රුපියල් මිලියන පහක් වූ (රු. 5,000,000.00) මූලික මුදල මත පොළිය ද;

(viii) 2025.05.02 දින සිට දේපළ වෙන්දේසි දිනය තෙක් වර්ෂයකට සියයට විස්සයි දශම දෙකක් පහක් වූ (20.25%) අනුපාතිකය යටතේ ඉහත කී අංක 135 සහ අංක 41 දරන උකස් බැඳුම්කර සම්බන්ධයෙන් වන විට එම උකස් බැඳුම්කර මගින් ඇපයෙන් සුරක්ෂිත කරන ලද රුපියල් මිලියන පහළොවයි ලක්ෂ තුනක් වූ (රු. 15,300,000.00) මූලික මුදල මත පොළිය ද;

අයකර ගැනීම සඳහා ඉහත කී උකස් බැඳුම්කර මගින් බැංකුව වෙත උකස් කරන ලද පහත උපලේඛනයේ විස්තර කර ඇති නිශ්චල දේපළෙහි බදු ගෙවීමෙන් නිදහස් සින්නක්කර අයිතිය සහ වෙනත් යම් අයිතිවාසිකම්, හිමිකම් සහ සම්බන්ධතා ඇතුළත්වන එම නිශ්චල දේපළ, අංක 134, බැද්දගාන පාර,කෝට්ටේ යන ලිපිනයේ පදිංචි (ජාතික හැඳුනුම්පත් අංක 194901910018 දරන) බලයලත් වෙන්දේසිකාර පුෂ්පකුමාර එඩ්වර්ඩ් සේනාපති මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි ("ප්‍රධාන පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ක්‍රියාකරමින් බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කර සිටිනු ලැබේ.

**පළමු උපලේඛනය**

බස්නාහිර පළාතේ, (අවිස්සාවේල්ල ලියාපදිංචි කොට්ඨාසයේ) කොළඹ දිස්ත්‍රික්කයේ, සීතාවක පළාත් පාලන ආයතනයේ, හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 444, මාවතගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මැද පත්තුවේ, හංවැල්ල AGAS කොට්ඨාසය ඇතුළත මාවතගම ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද, "හංවැල්ල වත්ත අලුපොතේ කොටස" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ජී. චන්ද්‍රසේන විසින් සාදන ලද 1992.08.23 දින වඩාත් නිවැරදිව 1992.08.25 දින අංක 50/92 දරන පිඹුරේ "ලොට් A සහ B" ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : ඩබ්. ගුණවර්ධන සහ තවත් අය විසින් හිමිකම් කියන ඉඩම ද; නැගෙනහිරට : අංක Co - 2705 දරන පිඹුරේ ලොට් අංක 13 හි ඉතිරි කොටස ද; දකුණට : එච්. ජේම්ස් සිංඤ්ඤෝ සහ තවත් අය විසින් හිමිකම් කියනු ලබන කුඹුරු ඉඩම ද; බටහිරට : හයිලෙවල් පාර ද යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, ඉහත කී අංක 50/92 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් අක්කර හතරයි පර්චස් විස්සක් වූ ද (අ.4, රූ.0, පර්.20) අවිස්සාවේල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ N188/201 දරන වෙලුමේ/ පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත්තා වූ ඉහත කී ලොට් A සහ B දරන බෙදා වෙන් කළ ඉඩම් කොටස් සහ ඒ මත වූ ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද වේ.

ඉහත කී ඉඩම් කොටස් නැවත මැන ඒකාබද්ධ කර පහත දැක්වෙන පරිදි නිරූපණය කර ඇත. එනම් -

ඉහත කී ආකාරයට පිහිටා ඇත්තා වූ ද වර්තමානයේ දී කොළඹ අලුත් පාර, වරිපනම් අංක 953 දරන පරිශ්‍රය වන්නා වූ ද (සර්වේයර් ජනරාල්වරයා විසින් සහතික කරන ලද 1992.09.14 දින අංක PPCo - 7312 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 01 දරන ඉඩම් කොටස සහ 1993.03.26 දින අංක PPCo - 7350 දරන පිඹුරේ ලොට් අංක 1 දරන ඉඩම් කොටස නැවත මැන වර්තමාන මායිම් ඒකාබද්ධ කිරීමක් වන්නා වූ ද, බලයලත් මිනින්දෝරු ජී. චන්ද්‍රසේන විසින් සාදන ලද 1992.08.23 දින වඩාත් නිවැරදිව 1992.08.25 දින අංක 50/92 දරන පිඹුරේ නිරූපිත ලොට් A

සහ ලොට් B දරන ඉඩම් කොටස් ඒකාබද්ධ කිරීමක් වන්නා වූ ද ) "හංවැල්ල වත්ත - අලුපොතේ කොටස" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ජී. චන්ද්‍රසේන විසින් සාදන ලද 2017.11.12 අංක 2470 දරන පිඹුරේ "ලොට් A" ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : කලින් ඩී. කේ. ඩේවිඩ් යන අය සහ තවත් අය විසින් හිමිකම් කියනු ලැබූ "අඹගහලන්ද වත්ත" යනුවෙන් හඳුන්වනු ලැබූ ඉඩම සහ PPCo - 2705 දරන පිඹුරේ ලොට් අංක 13 ද; නැගෙනහිරට : PPCo - 2705 දරන පිඹුරේ ලොට් අංක 13 ද; දකුණට : කලින් ජේම්ස් සිඤ්ඤෝ සහ තවත් අය විසින් හිමිකම් කියනු ලැබූ ඊරියගහ කුඹුර නමැති ඉඩම ද; සහ බටහිරට : කලින් ටී. කේ. ජේම්ස් සිඤ්ඤෝ සහ තවත් අය විසින් හිමිකම් කියනු ලැබූ දෙල්ගහවත්ත නමැති ඉඩම සහ පාර ද යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද ඉහත කී අංක 50/92 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් අක්කර හතරයි පර්චස් දොළහයි දශම දෙකක් වූ ද (අ.4, රූ.0, පර්. 12.21) ඉහත කී "ලොට් A" දරන බෙදා වෙන් කළ ඉඩම් කොටස වේ.

### දෙවන උපලේඛනය

උපාංග සමග විදුලිබල සැපයුම් පද්ධතිය, ජල සැපයුම් පද්ධති උපාංගය, විදුලි සංදේශ උපාංගය සහ වායුසමීකරණ උපාංගය ඇතුලු මෙහි පළමු උපලේඛනයේ සම්පූර්ණයෙන් විස්තර කර ඇති ඉහත කී ඉඩම් කොටස සඳහා සහ/හෝ ඒ මත වූ ගොඩනැගිල්ලට දැනට ස්ථිරව සම්බන්ධ කරනු ලැබ ඇති හෝ හෝ සවි කරනු ලැබ ඇති හෝ මෙහි මින් මතු කලින් කල ස්ථිරව සම්බන්ධ කරනු ලැබිය හැකි හෝ සවි කරනු ලැබිය හැකි සියලු එක්ව හා වෙන් වෙන්ව වූ නිශ්චල යන්ත්‍රාගාර සහ යන්ත්‍රෝපකරණ, උපාංග, සවිකුරු, සවිකිරීම් සහ සේවාවන් ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී.

04 - 315

---

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින්, 1974 අංක 10 දරන නීතියෙන් හා 2000 අංක 54 දරන පනතින් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 වන අධිකාරය) 21 වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2023.11.21 දින පවත්වන ලද රැස්වීමේදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදි:

1. ප්‍රසිද්ධ නොතාරිස් අයි. අයි. එම්. කේ. ජයසිංහ මහත්මිය විසින් සහතික කරන ලද 2021.12.27 දිනැති අංක 356 දරන උකස් බැඳුම්කරය මත රුපියල් මිලියන පනහක ණය මුදලක් මත 2023.10.02 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 63,566,233.95ක (රුපියල් හය කෝටි තිස්පන් ලක්ෂ හැටහය දහස් දෙසීය තිස්තුනයි ශත අනූපහක්) මුදලක් සමග රු. 46,234,485.88ක (රුපියල් හාර කෝටි හැටදෙලක්ෂ තිස්හතර දහස් හාරසිය අසූපහයි ශත අසූඅටක්) මුදලක් මත වරසකට සියයට දාහතයි දශම හතරයි හයක් (17.46%) බැගින් 2023.10.03 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද, ගම්පොල, ජයමාලපුර, නාවලපිටිය පාර, අංක 367/58 හි පිහිටි සීමාසහිත විරසූරිය බිල්ඩර්ස් පුද්ගලික සමාගම වෙතින් අයවිය යුතුව ඇත.

2. ප්‍රසිද්ධ නොතාරිස් අයි. අයි. එම්. කේ. ජයසිංහ මහත්මිය විසින් සහතික කරන ලද 2021.12.27 දිනැති අංක 356 දරන උකස් බැඳුම්කරය මත රුපියල් මිලියන පනහක ණය මුදලක් මත 2023.10.02 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 63,566,233.95ක (රුපියල් හය කෝටි තිස්පන් ලක්ෂ හැටහය දහස් දෙසිය තිස්තුනයි ශත අනූපහක්) මුදලක් ද, 2023.10.03 දිනට සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී පරිදි තවදුරටත් පොළිය ද ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවත, අංක 50/3 හි M/S T&H ඔක්ෂන් හි වෙන්දේසිකාර තුසිත් කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළකිරීමට ලංකා බැංකුව, ගම්පොල අධිශ්‍රේණි ශාඛාවේ කළමනාකරුට ද මෙයින් බලය පවරනු ලැබේ.

### උපලේඛනය

1. මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, උඩබුලත්ගම අඹගමුව කෝරළයේ, අඹගමුව ප්‍රාදේශීය සභා සීමාවේ හා අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රුවන්පුර - 320ඩී දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, (වඩා නිවැරදි ඔප්පුව රුවන්පුර - 320ජී දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය) කුඩාඔය හි පිහිටි, "කුඩාඔය එස්ටේට්" නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩී. එල්. ඩී. වයි. විජේවර්ධන විසින් සාදන ලද 2014 සැප්තැම්බර් මස 26 දිනැති අංක 15407 දරන පිඹුරේ ලොට් 2 ලෙස ලකුණු කර බෙදන ලද්දා වූ ඉඩම උතුරට : එකී අංක 15407 දරන පිඹුරේ ලොට් 5 සහ පී. පී. මහ 913 හි ලොට් 1 ද; නැගෙනහිරට : පී. පී. මහ 913 හි ලොට් 1 මෙල්ෆිල්ඩ් එස්ටේට්, එකී අංක 15407 දරන පිඹුරේ ලොට් 1 සහ ආගයිල් එස්ටේට් ද; දකුණට : එකී අංක 15407 දරන පිඹුරේ ලොට් 6 ලෙස ලකුණු කළ ආගයිල් එස්ටේට්, ආගයිල් එස්ටේට් සහ පාර ද ඉතා නිවැරදි ආගයිල් එස්ටේට්, ලොට් 6, ආගයිල් එස්ටේට් සහ පාර ද; බස්නාහිරට : පාර සහ එකී අංක 15407 දරන පිඹුරේ ලොට් 4 සහ 5 ද මායිම්ව අක්කර විසිහතයි, පර්චස් දහයයි දශම දෙකයි එකක් (අ.27, රූ.0, පර්.10.21) හෝ හෙක්ටෙයාර 10.9570ක් බිම් ප්‍රමාණයකින් යුත් අතර එහි පිහිටි ගොඩනැගිල්ල සහ සියලු දේ සමග එකී අංක 15407 දරන පිඹුරේ මායිම් නිරූපණය කළ පාරවල් දිගේ හා ඒ මත පාරේ අයිතිය ද වේ. මෙම ඉඩම ගම්පොල

ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 119/36 හි ලියාපදිංචි කර ඇත.

2. මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, උඩබුලත්ගම අඹගමුව කෝරළයේ, අඹගමුව ප්‍රාදේශීය සභා සීමාවේ හා අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රුවන්පුර - 320ජී දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කුඩාඔය හි පිහිටි "කුඩාඔය එස්ටේට්" නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩී. එල්. ඩී. වයි. විජේවර්ධන විසින් සාදන ලද 2014 සැප්තැම්බර් මස 26 දිනැති අංක 15407 දරන පිඹුරේ ලොට් 3 ලෙස ලකුණු කර බෙදන ලද්දා වූ ඉඩම, උතුරට : පාර ද; නැගෙනහිරට : පාර සහ ආගයිල් එස්ටේට් ද; දකුණට : ආගයිල් එස්ටේට් සහ පාර ද; බස්නාහිරට : පාර ද මායිම්ව රූඩ් දෙකයි පර්චස් විසිතුනයි දශම හතරයි බිංදුවක් (අ.0, රූ.2, පර්.23.70) හෝ හෙක්ටෙයාර 0.2624ක බිම් ප්‍රමාණයකින් යුත් අතර එහි පිහිටි ගොඩනැගිල්ල සහ සියලු දේ සමග එකී අංක 15407 දරන පිඹුරේ මායිම් නිරූපණය කළ පාරවල් දිගේ හා ඒ මත පාරේ අයිතිය ද වේ. මෙම ඉඩම ගම්පොළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 119/37 හි ලියාපදිංචි කර ඇත.

**දෙවන උපලේඛනය**

**යන්ත්‍ර සූත්‍ර ලැයිස්තුව**

පළමුවන උපලේඛනයේ විස්තර කළ ඉඩමට හා පරිශ්‍රයට සවි කර ඇති යන්ත්‍ර සූත්‍ර පහත සඳහන් දේවලින් සමන්විත වේ.

| *No.* | *Description* | *Quantity* | *Price* |
|---|---|---|---|
| 1. | 01 SET OF LB 1200 ASPHALT MIXING PLANT INCLUDES MAIN PART, BAG FILTER, 40M3 BITUMEN TANK, RECYCLE FILTER TANK, 10M3, DIESEL TANK, DUST MIXER HS CODE:84743200, INCO - TERMS : CIF | 01 | USD 418,500.00 |

සහ ඉහත පළමු උපලේඛනයේ විස්තර කර ඇති ඉඩමට සහ පරිශ්‍රයට දැනට සවිකර ඇති ඕනෑම ආකාරයක සහ විස්තර කර ඇති අනෙකුත් සියල්ල.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩී. ජී. වී. එල්. බංඩාර,
කළමනාකරු.

ලංකා බැංකුව,
අධිශ්‍රේණි ශාඛාව, ගම්පොල.

04-322

**ලංකා බැංකුව**

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2023.11.21 දින පවත්වන ලද රැස්වීමේදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. මාතර ප්‍රසිද්ධ නොතාරිස් පී. පී. ජී. දිනේෂා විසින් සහතික කරන ලද 2018 ඔක්තෝබර් මස 19 දිනැති අංක 65 දරන උකස් බැඳුම්කරය සහ 2019 මාර්තු මස 11 දිනැති අංක 280 දරන උකස් බැඳුම්කරය අනුව 1 වන ණය මත 2023.10.12 දිනය තෙක් මුදල් මුදල හා පොළිය වශයෙන් රු. 7,587,581.58ක (රුපියල් හැත්තෑ පන්ලක්ෂ අසූහත් දහස් පන්සිය අසූඑකයි ශත පනස් අටක්) මුදලක් සමග රු. 5,763,000.00ක (රුපියල් පනස් හත් ලක්ෂ හැටතුන් දාහක්) මුදලක් මත වසරකට සියයට දහතුනයි දශම පහක් (13.5%) බැගින් 2023.10.13 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද, 2 වන ණය මත 2023.10.12 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 11,933,678.07ක (රුපියල් එක්කෝටි දහනව ලක්ෂ තිස්තුන් දහස් හයසිය හැත්තෑ අටයි ශත හතක්) මුදලක් සමග රු. 8,943,223.91ක (රුපියල් අසූනව ලක්ෂ හතළිස් තුන් දහස් දෙසිය විසිතුනයි ශත අනූ එකක්) මුදලක් මත වසරකට සියයට දහතුනයි දශම පහක් (13.5%) බැගින් 2023.10.13 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද, මාතර, නාරංගල, කේ. බී. සිලෝන් ටී. වෙතින් අයවිය යුතුව ඇත.

2. මාතර ප්‍රසිද්ධ නොතාරිස් පී. පී. ජී. දිනේෂා විසින් සහතික කරන ලද 2018 ඔක්තෝබර් මස 19 දිනැති අංක 65 දරන උකස් බැඳුම්කරය සහ 2019 මාර්තු මස 11 දිනැති අංක 280 දරන උකස් බැඳුම්කරය අනුව 1 වන ණය මත රු. 7,587,581.58ක (රුපියල් හැත්තෑ පන්ලක්ෂ අසූහත් දහස් පන්සිය අසූඑකයි ශත පනස් අටක්) මුදලක් ද, 2 වන ණය මත රු. 11,933,678.07ක (රුපියල් එක් කෝටි දහනව ලක්ෂ තිස්තුන් දහස් හයසිය හැත්තෑ අටයි ශත හතක්) මුදලක් ද තව ද 2023.10.13 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී පරිදි පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවත, අංක 182/3 (50/3) ටී ඇන්ඩ් එච් ඔක්ෂන් හි වෙන්දේසිකාර තුසිත් කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළකිරීමට ලංකා බැංකුව, මාතර අධිශ්‍රේණි ශාඛා ප්‍රධාන කළමනාකාර මහතා හට ද මෙයින් බලය පවරනු ලැබේ.

### උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, ගඟබොඩ පත්තුවේ, තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ තිහගොඩ ප්‍රාදේශීය සභා සීමාවේ, නාරංගල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කිතලගම හි පිහිටි හේනවත්ත නමැති ඉඩමේ ලොට් 5හි ඒකාබද්ධ කරන ලද ලොට් 5ඒ, 5බී, 5සී බලයලත් මිනින්දෝරු බී. එච්. බී. නිහාල් සිල්වා විසින් සාදන ලද 2014 සැප්තැම්බර් මස 03 දිනැති අංක 0167/14 දරන පිඹුරේ මායිම් නිරූපණය කර ලොට් 1 ලෙස ලකුණු කළ බෙදන ලද්දා වූ විස්තර කළ ඉඩම් කැබැල්ල එනම්, එකී ලොට් 1, උතුරට : අංක 3806 දරන පිඹුරේ ලොට් 5ඩී සහ ලොට් 5 එච් ද; නැගෙනහිරට : බදුල්ලේ කැලේ ද; දකුණට : එම ඉඩමේ ලොට් 6 ද; බස්නාහිරට : ප්‍රාදේශීය සභා පාර ද මායිම් ව රූඩ් තුනයි පර්චස් දොළහක් (අ.0, රූ.03, පර්. 12) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි පිහිටි ගොඩනැගිලි, පස්, ගහකොළ, වැවිලි හා සියලු දේ සමග වේ. මෙම ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්68/139 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී. අයි. එස්. ගජනායක මහත්මිය,
ප්‍රධාන කළමනාකරු.

ලංකා බැංකුව,
මාතර අධිශ්‍රේණි ශාඛාව.

04-317

---

### ලංකා බැංකුව

## 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් හා 2000 අංක 54 දරන පනතින් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 වන අධිකාරය) 21 වන වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

දෙහිවල, කළුබෝවිල, එස්. ඩී. එස්. ජයසිංහ මාවතේ, සරසවි පාරේ, අංක 13/14 හි දයා ගෲප් ලිමිටඩ්හි (Daya Group Limited) වගකීම් වෙනුවෙන් උකස්කරන ලද අම්පාරේ පිහිටි බෝර්ඩ් ලෑන්ඩ් (BOARD LAND) යනුවෙන් හඳුන්වනු ලබන දේපළේ බදු අයිතිය.

2025.11.14 වැනි දින පවත්වන ලද රැස්වීමේ දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ජේ. සී. මහආරච්චි විසින් සහතික කරන ලද 2017.06.01 දිනැති අංක 460 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය අනුව ඇ.ඩො. 1,809,520.00 (ඇමෙරිකානු ඩොලර් දහඅට ලක්ෂ නවදහස් පන්සිය විස්සක් පමණි)ක වාර ණය පහසුකම මත 2025.10.01 වැනි දිනය දක්වා හිඟ මුල් මුදල හා පොළිය වශයෙන් ඇ.ඩො. 2,857,077.05ක (ඇමරිකානු ඩොලර් විසිඅට ලක්ෂ පනස්හත් දහස් හැත්තෑ හතයි ශත පහක් පමණි) මුදලක් ද, 2025.10.02 වැනි දින සිට එකී වාර ණය පහසුකමෙහි හිඟ මුල් මුදල මත එකතු විය යුතු වාර්ෂිකව ARR-SOFR (3M) + 3.0% (Floor Rate 5% වාර්ෂික) බැගින් වූ පොළී අනුපාතය යටතේ තවදුරටත් පොළිය හා අදාළ පරිදි වාර්ෂිකව 4% අනුපාතය යටතේ දඩ පොළිය ද දෙහිවල, කළුබෝවිල, එස්. ඩී. එස්. ජයසිංහ මාවතේ, සරසවි පාරේ, අංක 13/14 දයා ගෲප් ලිමිටඩ් (Daya Group Limited) ආයතනයෙන් ලංකා බැංකුවට අයවිය යුතුව ඇත.

2. අංක 460 දරන එකී උකස් බැඳුම්කරය අනුව ඇමරිකානු ඩොලර් විසිඅට ලක්ෂ පනස්හත් දහස් හැත්තෑ හතයි ශත පහක (ඇ.ඩො. 2,857,077.05) එකී මුදල ද, 2025.10.02 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී පරිදි තවදුරටත් අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත දෙවන උපලේඛනයෙහි සම්පූර්ණයෙන් විස්තර කොට ඇති දේපළෙහි බදු අයිතිය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවත, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර එම්. එච්. ටී. කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 19 වන වගන්තිය යටතේ හා එහි සංශෝධනය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළිකිරීම සඳහා ලංකා බැංකුවේ ආයතනික අයකරගැනීම් අංශයේ සබඳතා කළමනාකරුට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### පළමු උපලේඛනය

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, අම්පාර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සාමපුර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ අම්පාර ග්‍රාමයේ පිහිටි "බෝර්ඩ් ලෑන්ඩ්" නමැති රජයේ ඉඩමට මිනින්දෝරු ජෙනරාල් විසින් තහවුරු කරන ලද අංක 70 දරන Field Sheet හි අංක 280007 දරන කැඩැස්තර සැලැස්මෙහි ලොට් අංක 779 ලෙස නිරූපණය කර ඇති ඉඩම් කැබැල්ල, උතුරට : 777 හා 778 කොටස් ද; දකුණට : PP2114 හා 780 කොටස ද; නැගෙනහිරට : 778 කොටස හා PP2114 ද; බස්නාහිරට : 780 හා 775 කොටස් ද මායිම්ව හෙක්ටයාර හතරයි දශම හයයි එකයි හතක (හෙක්ටයාර 4.617) බිම් ප්‍රමාණයකින් යුක්ත වේ. මෙය අම්පාර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 03/91 හි ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

අම්පාර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 03/91 හි ලියාපදිංචි කරන ලද එකී ලොට් 779 හි හෙක්ටයාර 1.4437ක නොබෙදූ බිම් ප්‍රමාණය.

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, අම්පාර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැව්ගම් පත්තුව (උතුර), අම්පාරේ, H කලාපයේ, අම්පාර නගර සභා සීමාවේ, බලයලත් මිනින්දෝරු ලයන් එස්. නේසරාජා විසින් සාදන ලද 2016.06.19 දිනැති අංක SNR/2016/3010 දරන පිඹුරෙහි ලොට් A ලෙස විස්තර කරන ලද එකී නොබෙදූ බිම් ප්‍රමාණය, එනම් එකී ලොට් A; උතුරට : ලොට් 779 ද; නැගෙනහිරට : ලොට් 778 ද; දකුණට: PP 2114 ද; බස්නාහිරට : ලොට් 780 ද මායිම්ව හෙක්ටයාර 1.4437ක එනම්, අක්කර තුනයි රූඩ් දෙකයි පර්චස් දහයයි දශම අටයි බිංදුවක (A3, R2, P10.80) බිම් ප්‍රමාණයකින් හා එහි සියලු දේ සමග වේ.

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, අම්පාර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැව්ගම් පත්තුව (උතුර), අම්පාරේ, H කලාපයේ, අම්පාර නගර සභා සීමාවේ, බලයලත් මිනින්දෝරු ලයන් එස්. නේසරාජා විසින් සාදන ලද 2016.06.19 දිනැති අංක SNR/2016/3145 දරන පිඹුරෙහි ලොට් 3 ලෙස ද විස්තර කරන ලද එකී නොබදු බිම් ප්‍රමාණය එනම් එකී ලොට් 3; උතුරට : ලොට් 2 ද; නැගෙනහිරට : 778 කොටස ද; දකුණට : PP 2114 (වර්තමානයේ දොළපාර) ද; බස්නාහිරට : 780 කොටස (වර්තමානයේ දොළපාර) හා 775 කොටස ද මායිම්ව හෙක්ටයාර 1.4437ක එනම්, අක්කර තුනයි රූඩ් දෙකයි පර්චස් දහයයි දශම අටයි බිංදුවක (A3, R2, P10.80) බිම් ප්‍රමාණයකින් හා එහි සියලු දේ සමග වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඒ. සී. එච්. අතුකෝරල,
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණී,
අයකර ගැනීම් ආයතනික.

ලංකා බැංකුව,
අයකර ගැනීම් ආයතනික අංශය,
3 වන මහල,
අංක 1, ලංකා බැංකු මාවත,
කොළඹ 01.

04-319

---

**යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීමයි.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තිය ප්‍රකාරව යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින්මතු "යූනියන් බැංකුව" වශයෙන් හඳුන්වන,) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් යෝජනාව 2026 පෙබරවාරි මස 24 වැනි දින ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, කොටුගොඩ, ලන්ච්යවාඩිය, ආලෝක මාවත, අංක 20/1 දරන ලිපිනයේ පදිංචි ෂන්මුගම් රන්ජන් (ජාතික හැඳුනුම්පත් අංක 197724503809 දරන,) (මෙහි මින්මතු ඇතැම් තැනක "බන්ධනදායී" වශයෙන් හඳුන්වන,) යන අය විසින් කොළඹ 03, ගාලු පාර, අංක 64 දරන ලිපිනයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි සමාගම් ලියාපදිංචි කිරීමේ අංක PB676PQ දරන, යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින්මතු "යූනියන් බැංකුව" වශයෙන් හඳුන්වන,) වෙතින් නිවාස ණය පහසුකමක් ලබාගෙන ඇති බැවින් ද, එකී බන්ධනදායී විසින් ශ්‍රී ලංකා රුපියල් පනස්හත් ලක්ෂයක (රුපි. 5,700,000.00) මුදලක් සඳහා ප්‍රසිද්ධ නොතාරිස් යූ. ඩී. එන්. වානිකා විසින් සහතික කරන ලද අංක 1003 සහ 2025.03.03 දින දරන ලියාපදිංචි ප්‍රාථමික උකස් බැඳුම්කරය ඇපයක් වශයෙන් ලබා දී, ඉහත කී ණය පහසුකම මත යූනියන් බැංකුව වෙත අයවිය යුතු ශ්‍රී ලංකා රුපියල් පනස් හත් ලක්ෂයක (රුපි. 5,700,000.00) මුදල සහ ඒ මත පොළිය සහ වෙනත් අදාළ වන ගාස්තු ආපසු ගෙවා පියවා දැමීම පිණිස, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දැක්වෙන දේපළ ඇපයක් වශයෙන් උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද,

ඒ අනුව, ඉහත කී ණය පහසුකම මත 2025.12.28 වැනි දිනට මුළු හිඟ මුදල වන ශ්‍රී ලංකා රුපියල් පනස් අටලක්ෂ පනස්දහස් පන්සිය නවයකුත් ශත තිස්හයක (රුපි.5,850,509.36) මුදලක් සහ තව ද, ඊට අමතරව, ඉහත කී ණය පහසුකම මත මුල් හිඟ මුදල වන ශ්‍රී ලංකා රුපියල් පනස් පන්ලක්ෂ අසූපන්දහස් අටසිය විසිහතරකුත් ශත හැටඑකක (රුපි. 5,585,824.61) මුදල මත 2025.12.29 වැනි දින සිට එකී දේපළ විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 14% බැගින් පොළියක් ඉහත කී බන්ධනදායීන් වෙතින් යූනියන් බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන අතර, එම මුදල ගෙවා පියවා දමන ලෙස යූනියන් බැංකුව විසින් එකී බන්ධනදායී වෙතින් ඉල්ලීමක් සිදුකරනු ලැබුව ද, එම ඉල්ලීම ඉටුකිරීම බන්ධනදායී විසින් පැහැර හැරීම සිදුකරන ලද බැවින් ද,

එකී බන්ධනදායී විසින් ඉහත කී පරිදි ඉල්ලා සිටින ලද ණය ශේෂයන් හෝ එයින් යම් කවරම වූ කොටසක් ගෙවා පියවා දැමීම පැහැර හැරීම සිදුකර ඇති බවට යූනියන් බැංකුව විසින් සෑහීමකට පත්වීමෙන් පසුව, සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 03 වන වගන්තිය ප්‍රකාරව යූනියන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලය ප්‍රකාරව ක්‍රියාකරමින්, ඉහත කී ණය මත 2025.12.28 වැනි දිනට මුළු හිඟ මුදල වන ශ්‍රී ලංකා රුපියල් පනස් අට ලක්ෂ පනස්දහස් පන්සිය නවයකුත් ශත තිස්හයක (රුපි. 5,850,509.36) මුදල සහ ඉහත කී පරිදි පොළිය සහ ඉහත කී අංක 1003 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය සහ 1990 අංක 04 දරන එකී පනතේ 13 වන වගන්තිය යටතේ යූනියන්

බැංකුව වෙත අයකර ගැනීමට හිමිකම් ඇති වෙනත් සියලුම මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවා ඇති යම් මුදලක් වෙතොත් එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා, ප්‍රසිද්ධ නොතාරිස් යූ. ඩී. එන්. වානිකා විසින් සහතික කරන ලද අංක 1003 සහ 2025.03.03 දින දරන පවත්නා ලියාපදිංචි ප්‍රාථමික උකස් බැඳුම්කරය ප්‍රකාරව සහ ඊට යටත්ව යූනියන් බැංකුවට උකසට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දැක්වෙන එකී දේපළ, 1990 අංක 04 දරන එකී පනත ප්‍රකාරව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට බලයලත් දේපළ වෙන්දේසිකරුවන චන්දිමා ගමගේ ඔක්ෂනියර්ස් වෙත බලය පැවරීමට 1990 අංක 04 දරන එකී පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බලයලත් මිනින්දෝරු එස්. එස්. ජයලත් විසින් "දොඩම්ගහවත්ත" නමැති ඉඩමට මැන සාදන ලද අංක 8731 සහ 2022 අගෝස්තු මස 07 වැනි දින දරන පිඹුරේ නිරූපිත ලොට් A වශයෙන් ලකුණු කරන ලද, රූඩ් තුනකුත්, පර්චස් විසිහතරක් (අ.0, රූ.3, පර්.24) විශාල ඉඩම් කැබැල්ල වන අතර, මෙම දේපළ අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 6242/112 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම ලොට් 8 සහ 9 වශයෙන් නැවත මැන අනුබෙදා වෙන්කිරීමක් සිදු කොට මෙහි පහත සවිස්තරව දැක්වෙන පරිදි, G 734/14, 115 සහ 117 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත. එනම් -

(1) බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, ගහබඩ පත්තුවේ, දොම්පේ ප්‍රාදේශීය සභා සීමාව තුළ දොම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 416A දරන සමනබැද්ද ග්‍රාම නිලධාරි වසමේ, සමනබැද්ද ගමේ පිහිටි "දොඩම්ගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. එස්. ජයලත් විසින් මැන සාදන ලද අංක 9095 සහ 2022 දෙසැම්බර් මස 10 දින දරන පිඹුරේ නිරූපිත, ලොට් 8 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටසට මායිම් : උතුරට : ලොට් R1 ද; නැගෙනහිරට : ලොට් 9 ද; දකුණට : මිල්ලගහ වී වපුරන කුඹුර ද; බස්නාහිරට : ලොට් 7 ද, යන මෙකී මායිම් තුළ පිහිටි, ඉහත කී අංක 9095 දරන මානක පිඹුර අනුව පර්චස් දහයකුත් දශම හතයි පහක් (අ.0, රූ.0, පර්. 10.75) *නොහොත්* හෙක්ටයාර් 0.0272 විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි, පළතුරු ආදී සෑම සියලු දේත් සමග ය.

(2) බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, ගහබඩ පත්තුවේ, දොම්පේ ප්‍රාදේශීය සභා සීමාව තුළ දොම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 416A දරන සමනබැද්ද ග්‍රාම නිලධාරි වසමේ, සමනබැද්ද ගමේ පිහිටි "දොඩම්ගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. එස්. ජයලත් විසින් මැන සාදන ලද අංක 9095 සහ 2022 දෙසැම්බර් මස 10 දින දරන පිඹුරේ නිරූපිත, ලොට් 9 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටසට මායිම් : උතුරට : ලොට් R1 ද; නැගෙනහිරට : ලොට් 10 ද; දකුණට : මිල්ලගහ වී වපුරන කුඹුර ද; බස්නාහිරට : ලොට් 8 ද; යන මෙකී මායිම් තුළ පිහිටි, ඉහත කී අංක 9095 දරන මානක පිඹුර අනුව පර්චස් දහයකුත් දශම හතයි පහක් (අ.0, රූ.0, පර්.10.75) *නොහොත්* හෙක්ටයාර් 0.0272 විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි, පළතුරු ආදී සෑම සියලු දේත් සමග ය.

තව ද, ඉහත කී ඉඩම් කැබලිවලට මෙහි පහත සවිස්තරව දැක්වෙන ඉඩම් කැබලි මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග ය.

(1) ඉහත කී අංක 9095 දරන පිඹුරේ නිරූපිත ලොට් R1 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටසට මායිම්: උතුරට : එකී පිඹුරේ ලොට් 3, 2 සහ 1 ද; නැගෙනහිරට: උඩ පාර සහ ලොට් 7 ද; දකුණට : එකී පිඹුරේ ලොට් 10, 9, 8 සහ 7 ද; බස්නාහිරට : එකී පිඹුරේ ලොට් R2 ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දහතුනකුත් දශම නවයයි පහක් (අ.0, රූ.0, පර්. 13.95) *නොහොත්* හෙක්ටයාර් 0.0353 විශාල ඉඩම් කැබැල්ල වන අතර, මෙම දේපළ අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 734/14 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

(2) ඉහත කී සමනලබැද්ද ගමේ පිහිටි "දොඩම්ගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. එස්. ජයලත් විසින් මැන සාදන ලද අංක 9095 සහ 2022 දෙසැම්බර් මස 10 දින දරන පිඹුරේ නිරූපිත ලොට් R2 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටසට මායිම් : උතුරට : එකී පිඹුරේ ලොට් 4 ද; නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් R1 සහ 7 ද; දකුණට : එකී පිඹුරේ ලොට් 6 ද; බස්නාහිරට : එකී පිඹුරේ ලොට් 5 සහ D2 ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් තුනකුත් දශම එකයි බින්දුවක් (අ.0, රූ.0, පර්. 3.10) *නොහොත්* හෙක්ටයාර් 0.0079 ක් විශාල ඉඩම් කැබැල්ල වන අතර, මෙම දේපළ අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 734/15 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

04-298

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.